2006 අංක 10 දරණ පනත සහ ඉන්පසුව එම පනතට සිදු කර ඇති සංශෝධන මගින් සලසා ඇති විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් කාර්යාංශයේ සහ සේවක සුභසාධක අරමුදලෙහි බදු ගෙවිය යුතු ආදායම් මත ආදායම් බදු ගෙවීමට බැඳී සිටියි. ආදායම් බදු සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම් මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති ආදායම් සහ වියදම් මූලාංග මත පදනම්ව් තිබේ.

## 14. විදේශ ආධාර ගිණුම

විශේෂිත ප්‍රාග්ධන වියදම්වලට අදාළ විදේශ ආධාර වෙනමම අදායම් ලෙස සළකණු ලබන අතර ඒවා අදාළ වත්කමෙහි ප්‍රයෝජනවත් ආයු කාලය අනුව ආදායම් ප්‍රකාශයට බැර කරනු ලැබේ . අනෙකුත් ප්‍රදානයන් උපයෝජනය කරනු ලබන කාල පරිච්ඡේදය තුළදී ආදායම් ප්‍රකාශයට බැර කරනු ලැබේ.

## 15. විදේශගත සේවකයින්ගේ සුභසාධන අරමුදල

විදේශීය දූත මණ්ඩල විසින් කොන්ත්‍රාත් ගිවිසුම් ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් අයකරගන්නා මුදල් ලැබීම් වශයෙන් බැර කරනු ලබන අතර විදේශයන්හිදී කම්කරු සුභසාධන කටයුතුවලට අදාළව සිදුකරනු ලබන වියදම්වල එකතුව වියදම් ලෙස හර කරනු ලැබේ. ඉතිරිය ජංගම වගකීම් ලෙස ශේෂපත්‍රයේ පෙන්නුම් කරනු ලැබේ.

**16. කුවේට් වන්දි ගිණුම**

ගිණුම්වල පෙන්වා ඇති ශේෂයන් මගින් ගෙවීම් සිදු කර නොමැති වන්දි හිමිකම්පෑම්වල ශුද්ධ අගය සහ එම අරමුදල් ආයෝජනය කිරීමෙන් උපයාගත් පොලිය සහ විනිමය ප්‍රතිලාභ පෙන්නුම් කරයි. මෙම අරමුදල් එක්සත් ජාතීන්ගේ වන්දිගෙවීම් කමිටුව විසින් වන්දි මුදල් ගෙවා ඇති හිමිකම්පාන්නන් අතර බෙදා දීමට කාර්යාංශය අදහස් කරයි.

**17. අසම්භාව්‍ය බැරකම්**

සේවකයින් සහ බාහිර පුද්ගලයින් විසින් කාර්යාංශයට එරෙහිව අධිකරණවල පවරා විභාගකිරීමට ඇති නඩු 16 ක් තිබේ. (ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු 03ක් , අභියාචනාධිකරණයේ නඩු 04 ක් , මහාධිකරණයේ (කොළඹ) එක් නඩුවක්, දිසා අධිකරණවල නඩු 03 ක් සහ කම්කරු අධිකරණයේ නඩු 05 ක්)

මෙම නඩු විභාග කර තීන්දු දීමට ඇති බැවින් තථ්‍ය වගකීම ගණනය කළ නොහැක.

**18. විදේශ මුදල් ගනුදෙනු කිරීම්**

සියලුම විදේශ මුදල් ගනුදෙනු එම ගනු දෙනු බලපැවැත්වෙන වේලාව වන විට පවතින අනුපාතයට ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලැබේ. විදේශ මුදල් ඒකකවලින් නාමනය කර ඇති මුදල්මය වත්කම් සහ වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරනු ලබන වර්ෂ අවසාන විදේශ විනිමය අනුපාත යොදාගනිමින් ඒවාට අනුරූප ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනය කරනු ලැබේ.

**19. ආදායම**

**නියෝජිතායතන විසින් බඳවාගැනීම් සිදු කිරීමේදී පහසුකම් ගාස්තු සහ බඳවාගැනීමේ ගාස්තු පහත සඳහන් පරිදි ගණනය කරනු ලැබේ:**

| වැටුප රු. | ගෙවිය යුතු ගාස්තු රු. | පහසුකම් ගාස්තු රු. | බඳවාගැනීම් ගාස්තු රු. | නියෝජිතායතනයේ කොටස (70%) රු. | සටහන් |
|---|---|---|---|---|---|
| 5,000 ට අඩු | 3,200 | 200 | 900 | 2,100 | |
| 5,000– 10,000 | 5,200 | 200 | 1,500 | 3,500 | |
| 10,00020,000 | 7,700 | 200 | 2,250 | 5,250 | |
| 20,000 ට වැඩි | 10,200 | 200 | 3,000 | 7,000 | |

කාර්යාංශය විසින් සිදුකළ පුද්ගලික බඳවාගැනීම් සඳහා ගාස්තු අයකිරීමේදී මුළු ලැබීම් පහසුකම් ගාස්තු සහ බඳවාගැනීමේ ගාස්තු ලෙස ගණනය කර ඇත. ලියාපදිංචි ගාස්තු (පුද්ගලික), ලියාපදිංචි ගාස්තු (නියෝජිතායතන), බලපත්‍ර ගාස්තු, පුහුණු ගාස්තු, සෙස් ආදායම, ආයෝජන

ආදායම සහ වෙනත් ආදායම් උපචිතවීමේ පදනමින් නිර්ණය කරනු ලැබේ.

20

| මෙහෙයුම් ආදායම | සමූහය 2013 - රු. | කාර්යාංශය 2013 - රු. | සමූහය 2012 - රු. | කාර්යාංශය 2012රු. |
|---|---|---|---|---|
| බඳවාගැනීමේ ගාස්තු - නියෝජිතායතනය | 511,056,500 | 511,056,500 | 491,972,250 | 491,972,250 |
| බඳවාගැනීමේ ගාස්තු - පුද්ගලික | 600,521,500 | 600,521,500 | 544,049,300 | 544,049,300 |
| පහසුකම් ගාස්තු | 58,311,200 | 58,311,200 | 56,818,485 | 56,818,485 |
| බලපත්‍ර ගාස්තු | 80,209,500 | 80,209,500 | 28,610,000 | 28,610,000 |
| සෙස් ආදායම | 21,951,865 | 21,951,865 | 28,702,383 | 28,702,383 |
| කොරියන් පරිපාලන ගාස්තු | 21,694,482 | 21,694,482 | 20,580,416 | 20,580,416 |
| කොරියන් නැවත ඇතුල්වීමේ ගාස්තු - ලේඛනගතකිරීමේ සහ පද්ධති නඩත්තු | 9,295,840 | 9,295,840 | 2,012,319 | 2,012,319 |
| කොරියන් පුහුණු ගාස්තු | 57,412,419 | 57,412,419 | 53,544,032 | 53,544,032 |
| දැන්වීම් අනුමැතිය | 79,265 | | 374,514 | |
| පුහුණු ආදායම | 180,857,021 | 180,857,021 | 231,298,245 | 231,298,245 |
| බඳවාගැනීම් ආදායම | 10,103,863 | | 4,983,195 | |
| නියෝජිතායතන හිමිකම්පෑම | 3,129,000 | | 2,887,500 | |
| නියෝජිතායතන කොමිස් මුදල් | | | 188,555 | |
| වෙනත් ආදායම් | 33,843,068 | | | |
| එකතුව | **1,588,465,523** | **1,541,310,327** | **1,466,021,194** | **1,457,587,430** |

21

| වෙනත් මෙහෙයුම් ආදායම් | සමූහය 2013 - රු. | කාර්යාංශය 2013 - රු. | සමූහය 2012 - රු. | කාර්යාංශය 2012-රු. |
|---|---|---|---|---|
| විදේශ ආධාර සහ ප්‍රදාන | 214,959 | 214,959 | 208,643 | 208,643 |
| ජා.ක.ස. ව්‍යාපෘතියෙන් ලැබුණු දායක මුදල් | - | - | 850 | 850 |
| **ගුවන් ටිකට්පත් අංශයට ලැබුණු කොමිස්** | 7,043,486 | 7,043,486 | 4,666,046 | 4,666,046 |
| ආයෝජනවලින් ලැබුණු පොළිය (සටහන 10) | 361,105,699 | 361,105,699 | 420,614,878 | 420,614,878 |
| විදේශගත සේවකයින්ගේ සුභසාධන අරමුදල් ප්‍රතිපූරණ | 617,550,479 | 617,550,479 | 530,302,135 | 530,302,135 |
| විදේශ මුදල් විනිමය ප්‍රතිලාභ / (අලාභ) | | | - | - |
| කාර්ය මණ්ඩල ණය පොළී | 11,182,279 | 11,182,279 | 10,231,340 | 10,231,340 |
| විවිධ ආදායම් | 332,029,966 | 332,029,966 | 46,699,523 | 46,699,523 |
| ඉතුරුම් මත පොළිය | 949,109 | - | 720,912 | |
| ස්ථාවර තැන්පතු මත පොළිය | 15,268,113 | - | 8,818,962 | |
| කුලී ආදායම | | | - | |
| වාහන බැහැරකිරීමෙන් ලැබූ ලාභය | | | 601,339 | |
| වෙනත් ආදායම් | 5,840,742 | 750,000 | 10,400,735 | |
| එකතුව | **1,351,184,832** | **1,329,876,868** | **1,033,265,363** | **1,012,723,415** |

## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
## 2013.12.31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය

| විස්තරය | 2013 | | | 2012 |
|---|---|---|---|---|
| | කාර්යාංශය<br>රු | සේ.සු.අරමුදල<br>රු | එකතුව<br>රු | සත්‍ය<br>රු |
| ආදායම් | | | | |
| බඳවා ගැනීම් ගාස්තු- නියෝජිතායතන | 343,064,250 | 167,992,250 | 511,056,500 | 491,972,250 |
| බඳවා ගැනීම් ගාස්තු- පුද්ගල | 540,469,350 | 60,052,150 | 600,521,500 | 544,049,300 |
| පහසුකම් ගාස්තු | 58,311,200 | - | 58,311,200 | 56,818,485 |
| බලපත්‍ර ගාස්තු | 80,209,500 | - | 80,209,500 | 28,610,000 |
| සෙස් | 21,951,865 | - | 21,951,865 | 28,702,383 |
| කොරියානු පරිපාලන ගාස්තු | 21,694,482 | | 21,694,482 | 20,580,416 |
| යළි පිටත්වීමේ කොරියානු ගාස්තු - ලේඛණ හා ක්‍රමවේද | 9,295,840 | | 9,295,840 | 2,012,319 |
| පුහුණු ගාස්තු | | 180,857,021 | 180,857,021 | 231,298,245 |
| කොරියානු පුහුණු ගාස්තු | | 57,412,419 | 57,412,419 | 53,544,032 |
| **එකතුව** | **1,074,996,487** | **466,313,840** | **1,541,310,327** | **1,457,587,430** |
| **එකතු කළා වෙනත් ආදායම්** | | | | |
| විදේශාධාර හා ප්‍රදාන | 54,209 | 160,751 | 214,959 | 208,643 |
| ILO ව්‍යාපෘතියට ලැබූ දායක මුදල් | - | - | - | 850 |
| **ගුවන් ටිකට් ඒකකයෙන් ලැබූ කොමිස්** | 7,043,486 | | 7,043,486 | 4,666,046 |
| ආයෝජන පොළිය | 207,860,854 | 153,244,845 | 361,105,699 | 420,614,878 |
| විදේශීය සේවක සුභසාධන අරමුදලේ වියදම් ප්‍රතිපූර්ණය | - | **617,550,479** | **617,550,479** | 530,302,135 |
| සේවක ණය සඳහා ලද පොළී | 11,182,279 | - | 11,182,279 | 10,231,340 |
| ශ්‍රී.ල.වි.රැ.නියෝජිත සමාගමෙන් ලද ලාභාංශ | 750,000 | - | 750,000 | |
| ස්ථාවර වත්කම් විකුණුමෙන් ලද ලාභ | | - | - | - |
| විවිධ ආදායම් | 321,753,325 | 10,276,641 | 332,029,966 | 46,699,523 |
| **සෙ.සු.අරමුදලට දායක (කාර්යාංශයෙන්)** | **(204,000,000)** | **204,000,000** | | |
| | **344,644,153** | **985,232,714** | **1,329,876,868** | **1,012,723,415** |
| **මුළු ආදායම** | **1,419,640,640** | **1,451,546,555** | **2,871,187,195** | **2,470,310,845** |
| **අඩුකළා - වියදම්** | | | | |
| **සේවක පිරිවැය** | **630,628,037** | **40,364,373** | **670,992,410** | **507,365,922** |
| **ආයතනික වියදම්** | **161,417,529** | **83,066,204** | **244,483,733** | **206,429,647** |
| **මෙහෙයුම් පිරිවැය** | **217,995,589** | **27,025,183** | **245,020,772** | **216,802,298** |
| **දැන්වීම් හා ප්‍රචාරණය** | **56,794,282** | **25,236,439** | **82,030,721** | **49,683,380** |
| **ව්‍යාපාර ප්‍රවර්ධන පිරිවැය** | **45,648,305** | - | **45,648,305** | **90,632,213** |
| **සේවක සුභසාධන අරමුදලේ වියදම්** | - | **1,273,294,305** | **1,273,294,305** | **1,146,187,261** |
| **මුළු වියදම** | **1,112,483,742** | **1,448,986,504** | **2,561,470,246** | **2,217,100,720** |
| **වියදමට වඩා ආදායමේ අතිරික්තය** | **307,156,898** | **2,560,050** | **309,716,949** | **253,210,125** |
| **ආදායම් බදු සඳහා වෙන්කිරීම** | **86,003,932** | **716,814** | **86,720,746** | **87,727,184** |
| **සමුච්චිත අරමුදලට ගෙන ගිය ශේෂය** | **221,152,967** | **1,843,236** | **222,996,203** | **165,482,942** |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | | | |
| විදේශීය ගණුදෙනු පරිවර්ථනයෙන් ලද විනිමය ලාභ/අලාභ | | 11,649,013 | 11,649,013 | 5,261,558 |
| | 8,503,555 | | 8,503,555 | - |
| ප්‍රත්‍යගණන ලාභ | | | | |
| විශ්‍රාම සැළසුමේ ආයු ගණන තක්සේරුව මත ලාභ/අලාභ | | | | |
| **වෙනත් විස්තීරණ ආදායම්** | **8,503,555** | **11,649,013** | **20,152,568** | **5,261,558** |
| **මුළු විස්තීරණ ආදායම** | **229,656,522** | **13,492,249** | **243,148,771** | **170,744,500** |

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ වියදම් ප්‍රකාශය

| විස්තරය | සමූහය 2013 රු | '2013 කාර්යාංශය රු | '2013 සේ.සු.අරමුදල රු | කාර්යාංශය 2013 රු | සමූහය 2012 රු | කාර්යාංශය 2012 රු |
|---|---|---|---|---|---|---|
| සේවක මණ්ඩල පිරිවැය | | | | | | |
| වැටුප් හා වේතන | 347,652,343 | 319,320,105 | 16,832,791 | 336,152,897 | 254,950,004 | 245,969,458 |
| කාර්යමණ්ඩල සුභසාධනය | 81,981,502 | 76,527,121 | 4,375,746 | 80,902,867 | 80,890,301 | 79,603,795 |
| සේ.අ.අ සහ සේ.නි.භා.අරමුදල් දායක | 59,305,085 | 55,374,199 | 2,914,432 | 58,288,631 | 39,544,632 | 38,698,256 |
| නිවාස ණය වල පොළිය ප්‍රතිපූර්ණය | 6,730,235 | 6,323,534 | 406,700 | 6,730,235 | 6,546,671 | 6,546,671 |
| ප්‍රසාද දීමනා | 70,039,233 | 65,072,104 | 3,391,184 | 68,463,288 | 53,354,496 | 51,829,527 |
| අතිකාල | 73,772,296 | 69,260,980 | 3,642,455 | 72,903,434 | 50,699,120 | 50,083,999 |
| ගමන් වියදම් | 16,449,044 | 13,294,109 | 3,120,524 | 16,414,633 | 10,186,374 | 10,012,789 |
| පාරිතෝෂික | 25,488,012 | 19,718,756 | 5,378,586 | 25,097,342 | 18,264,845 | 18,129,427 |
| කාර්ය මණ්ඩල පුහුණු කිරීම් | 6,055,273 | 5,737,129 | 301,954 | 6,039,083 | 6,492,000 | 6,492,000 |
| | **687,473,024** | **630,628,037** | **40,364,373** | **670,992,410** | **520,928,442** | **507,365,922** |
| ආයතනික වියදම් | | | | | | |
| මුද්‍රණ,ලිපි ද්‍රව්‍ය හා පාරිභෝජන භාණ්ඩ | 40,493,196 | 34,845,475 | 4,742,294 | 39,587,769 | 39,959,165 | 39,139,949 |
| දූරකථන හා තැපැල් | 45,613,547 | 40,446,397 | 4,148,056 | 44,594,454 | 37,968,382 | 37,117,740 |
| කුළී | 47,809,672 | 17,396,186 | 30,413,486 | 47,809,672 | 38,660,416 | 38,660,416 |
| පරිශ්‍ර නඩත්තු කිරීම | 15,910,284 | 10,807,660 | 3,715,087 | 14,522,747 | 14,529,693 | 13,927,774 |
| විගණන ගාස්තු | 708,768 | 507,080 | 26,688 | 533,768 | 980,415 | 805,415 |
| විදුලි | 44,283,196 | 35,690,655 | 8,029,038 | 43,719,693 | 37,596,998 | 37,115,195 |
| ආරක්ෂක ගාස්තු | 42,293,903 | 15,644,744 | 26,027,277 | 41,672,022 | 30,250,078 | 29,751,757 |
| කැලි ක්‍රමයට සේවය කරන්නන්ගේ පිරිවැය | 31,175 | 29,616 | 1,559 | 31,175 | 4,040 | 4,040 |
| අධ්‍යක්ෂක වරුන්ගේ ගාස්තු හා ගමන් වියදම් | | 612,750 | 30,750 | 643,500 | 952,961 | 612,001 |
| ජලය | 6,942,870 | 2,576,079 | 4,228,103 | 6,804,183 | 5,329,239 | 5,204,463 |
| උපදේශණ හා නීති ගාස්තු | 5,591,617 | 2,860,886 | 1,703,865 | 4,564,751 | 6,655,637 | 4,090,897 |
| | **249,678,228** | **161,417,529** | **83,066,204** | **244,483,733** | **212,887,023** | **206,429,647** |
| මෙහෙයුම් පිරිවැය | | | | | | |
| ස්ථාවර වත්කම් ක්ෂය වීම | 162,510,196 | 137,966,941 | 20,397,093 | 158,364,034 | 137,501,805 | 131,657,259 |
| මෝටර් වාහන ධාවන වියදම් | 63,492,974 | 54,955,056 | 3,505,602 | 58,460,658 | 45,098,866 | 42,907,163 |
| වාහන කුළියට ගැනීම | 11,581,887 | 10,747,367 | 568,128 | 11,315,495 | 16,554,424 | 16,429,424 |
| ආර්ථික සේවා ගාස්තු | - | - | - | - | 9,627,983 | 9,627,983 |
| පරිගණක මෙහෙයුම් වියදම් | 4,251,246 | 3,953,999 | 208,105 | 4,162,104 | 4,788,611 | 4,693,346 |
| කාර්යාලීය උපකරණ නඩත්තුව | 8,942,520 | 6,835,065 | 1,896,216 | 8,731,282 | 4,874,237 | 4,874,237 |
| මූල්‍යමය ගාස්තු (ණය පොළී,කුලී ගාස්තු,කුලී වාරික) | 2,182,141 | 1,614,784 | 106,444 | 1,721,228 | 1,329,549 | 853,839 |
| පුවත්පත් සහ වාර ප්‍රකාශන | 1,389,434 | 1,113,955 | 239,380 | 1,353,334 | 1,109,893 | 1,059,833 |
| දූර්වල ණය කරුවන් සඳහා ප්‍රත්පාදන | 144,112 | 144,112 | - | 144,112 | - | - |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද අලාභය | - | - | - | - | 122,485 | 122,485 |
| පොදු වියදම් | 1,191,909 | 664,310 | 104,215 | 768,525 | 5,964,002 | 4,576,729 |
| | **255,686,419** | **217,995,589** | **27,025,183** | **245,020,772** | **226,971,855** | **216,802,298** |
| වෙළඳ දැන්වීම් හා ප්‍රචාරණය | | | | | | |
| දැන්වීම් | 42,911,684 | 24,232,884 | 16,543,688 | 40,776,572 | 20,175,279 | 19,360,846 |
| රූපවාහිනී වැඩ සටහන් සඳහා ප්‍රචාරනය | 8,646,606 | 7,531,439 | 1,115,167 | 8,646,606 | 1,419,557 | 1,419,557 |
| ගුවන් විදුලි වැඩසටහන් සඳහා පිරිවැය | 7,280,446 | 3,961,134 | 3,319,312 | 7,280,446 | 12,882,401 | 12,882,401 |
| දැනුවත් කිරීමේ වැඩසටහන් | 25,463,753 | 21,068,825 | 4,258,272 | 25,327,097 | 16,020,576 | 16,020,576 |
| | 84,302,488 | 56,794,282 | 25,236,439 | 82,030,721 | 50,497,813 | 49,683,380 |
| ව්‍යාපාර ප්‍රවර්ධන වියදම් | | | | | | |
| ව්‍යාපාර ප්‍රවර්ධන සංචාර | 26,983,037 | 25,905,405 | - | 25,905,405 | 49,357,705 | 46,082,248 |
| වෙළඳපොළ ප්‍රවර්ධන කටයුතු | 14,701,564 | 11,526,883 | - | 11,526,883 | 9,632,883 | 9,632,883 |
| කොරියානු ව්‍යාපෘතියේ වියදම් සහ බඳවා ගැනීමේ වියදම් | 8,973,804 | 6,725,831 | - | 6,725,831 | 26,512,980 | 26,442,163 |
| ගුවන් ටිකට් පත් ඒකකයේ සෘජු වියදම් | 6,214 | 6,214 | - | 6,214 | - | - |
| සම්මන්ත්‍රණ හා වැඩමුළු | 1,483,972 | 1,483,972 | - | 1,483,972 | 8,474,920 | 8,474,920 |
| | **52,148,591** | **45,648,305** | - | **45,648,305** | **93,978,488** | **90,632,213** |

| විස්තරය | සමූහය 2013 රු | '2013 කාර්යාංශය රු | '2013 සේ.සු.අරමුදල රු | කාර්යාංශය 2013 රු | සමූහය 2012 රු | කාර්යාංශය 2012 රු |
|---|---|---|---|---|---|---|
| සේවක සුභසාධක අරමුදල | | | | | | |
| පුහුණු කිරීමේ කටයුතු | 163,881,622 | | 159,841,808 | 159,841,808 | 201,031,305 | 212,103,040 |
| විදේශ සේවක සුභසාධක අරමුදලේ වියදම් | 617,550,479 | - | 617,550,479 | 617,550,479 | 530,314,019 | 530,302,135 |
| විගමන සේවකයන්ගේ රක්ෂණ පිරිවැය | 249.472.235 | - | 249.472.235 | 249.472.235 | 225,326,646 | 225,326.646 |
| විගමන සේවකයන්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව | 1.737.061 | - | 1.737.061 | 1.737.061 | 54,476,691 | 54,476,691 |
| පාසල් පොත් බෙදා දීම | 18,235,657 | - | 18,235,657 | 18,235,657 | 14,671,862 | 14,671,862 |
| බැංකු ණය සඳහා පොළී සහන | 531,118 | - | 531,118 | 531,118 | 433,673 | 433,673 |
| සුභසාධන මධ්‍යස්ථානය - සීදූව | 21,678,950 | - | 21,678,950 | 21,678,950 | 18,400,040 | 18,400,040 |
| විගමණික සේවකයන්ගේ ඪායකත්වයේ | 553.446 | - | 553.446 | 553.446 | 504,889 | 504.889 |
| දේශීය හා විදේශීය සුභසාධන කටයුතු | 575,569 | - | 575,569 | 575,569 | 2,142,532 | 2,142,532 |
| ලෝක බැංකු ජා.ක.සං.ව්‍යාපෘති වියදම් | - | - | - | - | 850 | 850 |
| ප්‍රත්‍යානුකළන වැඩසටහන් | 479,000 | - | 479,000 | 479,000 | 189,262 | 189,262 |
| විගමණික සේවකයන් සළහා සමාජ | 6.201.753 | - | 6.201.753 | 6.201.753 | 10,142,538 | 10.142.538 |
| ආබාධිත විගමන සේවකයන් සඳහා නිවාස | 5,268,642 | - | 5,268,642 | 5,268,642 | 2,901,510 | 2,901,510 |
| විගමණික සේවකයන් සඳහා සුභසාධන පහසුකම් | 169,282 | - | 169,282 | 169,282 | 262,360 | 262,360 |
| විගණන සඳහා විදේශ ගමන් | 1,572,458 | | 1,572,458 | 1,572,458 | 3,884,515 | 3,884,515 |
| පුහුණු වැඩසටහන් පැවැත්වීම | - | - | - | - | 27,109 | 27,109 |
| අවමඟුල් වියදම් සඳහා විශේෂ ප්‍රධාන | 1,290,500 | - | 1,290,500 | 1,290,500 | 90,000 | 90,000 |
| රැකියා සපයන රටවල් වෙත අධ්‍යන සංචාර | 4.407.854 | - | 4.407.854 | 4.407.854 | 4,786,440 | 4,786.440 |
| විගමන සේවකයන් සඳහා වෛද්‍ය බිල් | 4,401,232 | - | 4,401,232 | 4,401,232 | 119,784 | 119,784 |
| ගාස්තු මත වැටබදු හා ජාතිය ගොඩනැඟීමේ බදු ගෙවීම | 10,962,285 | | 10,962,285 | 10,962,285 | 11,871,366 | 11,871,366 |
| දරු දිරිය වැඩසටහනේ වියදම් | 12,987,904 | | 12,987,904 | 12,987,904 | 1,136,007 | 1,136,007 |
| ළමා ආරක්ෂණය ඉහළ නැංවීමේ වැඩසටහන් | 901,000 | | 901,000 | 901,000 | 120,000 | 120,000 |
| පැමිණිලි කරුවන්ට බස් ගාස්තු හා ආහාරපාන | 502,166 | | 502,166 | 502,166 | 139,653 | 139,653 |
| මතු අස්වනු උදෙසා ළමා කෙත අස්වැද්දුම | - | | - | - | 1,460,254 | 1,460,254 |
| විගමණික සේවකයන් සහ පවුල් සඳහා | 94,599 | | 94,599 | 94,599 | 1,047,581 | 1,047,581 |
| ජාත්‍යන්තර සංක්‍රමණිකයන්ගේ දිනයේ වියදම් | 8,094,700 | | 8,094,700 | 8,094,700 | 44,861,986 | 44,861,986 |
| රටවිරු ව්‍යාපෘතියේ වියදම් | 37,817,875 | | 37,817,875 | 37,817,875 | 4,003,503 | 4,003,503 |
| පෙර විගමණික නම්‍ය කරණ වැඩසටහනේ වියදම් | 499,805 | | 499,805 | 499,805 | 781,037 | 781,037 |
| කොරියානු රැකියා සඳහා බඳවාගැනීමේ සුභසාධන වියදම් | 7,685,900 | | 7,685,900 | 7,685,900 | | |
| රටවිරු ටැලන්ට් ස්ටාර් වැඩසටහන | 105.174.143 | | 99.781.027 | 99.781.027 | | |
| | 1,282,727,235 | - | 1,273,294,305 | 1,273,294,305 | 1,135,127,410 | 1,146,187,261 |

**22. වියදම්**

කාර්යාංශය විසින් සේවක සුභසාධනය වෙනුවෙන් දරන ලද, සෘජුවම හඳුනාගත නොහැකි වියදම් මහා භාණ්ඩාගාරයේ පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර ඇති පරිදි 2005 වර්ෂයේ සිට පහත සඳහන් පදනමින් බෙදා වෙන් කරනු ලැබේ:

ගාස්තු

| | |
|---|---|
| වැටුප් සහ වේතන | 5% |
| අතිකාල | 5% |
| සේ.නි.භා.අ. සහ වේතන | 5% |
| ප්‍රසාද දීමනා | 5% |
| ගමන්වියදම් සහ යැපීම් | 5% |
| පාරිතෝෂික | 5% |
| කාර්ය මණ්ඩල සුභසාධන සහ පුහුණු | 5% |
| සේවකයින් සඳහා වන්දි | 5% |
| මුද්‍රණ ලිපිද්‍රව්‍ය සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය | 5% |
| දුරකථන සහ තැපැල් ගාස්තු | 5% |
| ගොඩනැගිලි කුලී | 5% |
| පරිශ්‍රය නඩත්තු කිරීම | 5% |
| විගණන ගාස්තු | 5% |
| ජලය සහ විදුලිය | 5% |
| ආරක්ෂක ගාස්තු | 5% |
| කැලි ක්‍රමයට ගාස්තු ගෙවන සේවක පිරිවැය | 5% |
| අධ්‍යක්ෂ ගාස්තු සහ ගමන් වියදම් | 5% |
| උපදේශන සහ නීති ගාස්තු | 5% |
| මෝටර් වාහන ධාවන වියදම් | 5% |
| වාහන කල්බදු ගැනීම | 5% |
| හර බද්ද | 5% |
| ආර්ථික සේවා ගාස්තු | 5% |
| පර්ගණක පවත්වාගෙන යාමේ පිරිවැය | 5% |
| උපකරණ නඩත්තු කිරීම | 5% |
| මූල්‍ය ගාස්තු | 5% |
| පුවත්පත් සහ වාර සඟරා | 5% |
| බොල් ණයගැතියන් සඳහා වෙන්කිරීම් | 5% |
| පොදු වියදම් | 5% |

විකුණුම් වත්කම් මත අලාභය 5%

දැන්වීම 5%

රූපවාහිනී සහ ගුවන්විදුලි වැඩසටහන් 5%

දැනුවත් කිරීමේ වැඩසටහන 5%

**විලම්බිත වියදම්**

එක් මුදල් වර්ෂයකට වඩා වැඩි ගණනකට ප්‍රතිලාභයක් හෝ සම්බන්ධයක් ඇතැයි සළකණු ලබන වියදම් විලම්බික වියදම් ලෙස කාණ්ඩ කරනු ලැබේ. එවැනි වියදම් ඒවා අදාළ වන කාල පරිච්ඡේදය තුළ සරල රේඛීය පදනමකින් කපාහරිනු ලැබේ.

**23.** ආදාළ පාර්ශවයන් සමග සිදුකළ ගනුදෙනු

(i). සීමාසහිත ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිතායතන (පුද්) සමාගම 2012 වර්ෂය තුළ 70% නියෝජිතායතන කොමිස් ලෙස රු.3,085,125/- ක මුදලක් ගෙවන ලෙස කාර්යාංශයෙන් ඉල්ලා ඇත.

(ii). පහත සඳහන් විදේශ රැකියා නියෝජිතායතනවල බලපත්‍රලාභීන් 2012 වර්ෂයේදී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ලෙස කටයුතු කළහ. 2012 වර්ෂයේදී බඳවාගැනීමේ ගාස්තුවලින් 70% ක කොටස ලෙස ඔවුන් වෙත ආපසු ගෙවන ලද මුදල් පහත සඳහන් පරිදි වේ.

| අධ්‍යක්ෂවරයාගේ නම | නියෝජිතායතනය | ආපසු ගෙවන ලද මුදල (රු.) |
|---|---|---|
| බී.පී. නියංදඬුපොල මහතා | දේශක්ති ලංකා එන්ටර්ප්‍රයිසස් (L.L. NO.1534) | 9,961,000 |
| ඒ.ආර්.බී. නිමත්දීන් මහතා | කිව්.පී. එම්ප්ලෝයිමන්ට (පුද්) සමාගම (L.L.1316) | 25,324,250 |
| එම්.එම්. මන්සූර් මහතා | ෆා එන්ටර්ප්‍රයිසස් (පුද්) සමාගම (L.L.428) | 976,500 |
| එල්.ඒ.ආර්. පෙරේරා මහතා | ලැගෝඩාන් (පුද්) සමාගම | 3,689,000 |

**24.** **ගෘහස්ථ අංශය විසින් ගෙවිය යුතු ලියාපදිංචි ගාස්තු සඳහා ජාතිය ගොඩනැගීමේ බදු සහ වැට් බදු සහන ලබාදීම.**

කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනුලැබූ තීරණය පරිදි තමන්ගේම සම්බන්ධතා හරහා විදේශ රැකියා සඳහා පිටත්ව ගිය ගෘහස්ථ අංශයේ ශ්‍රී ලාංකික සේවකයින් විසින් ගෙවනු ලැබූ ලියාපදිංචි ගාස්තු සඳහා ජා.ගො.බ. සහ වැට් බදු සහනයක් ලබාදීමට පියවර ගෙන ඇත.

2012 වර්ෂය තුළදී, කාර්යාංශය විසින් සපයා දෙනු ලබන සුභසාධන ක්‍රියාමාර්ගයක් ලෙස කාර්යාංශය රු. 11,871,366 ක මුදලක් වැය කර ඇත.

**25. වෙනත් ගනුදෙනු**

විදේශ රැකියා ලොතරැයි ජයග්‍රාහකයින් සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආරම්භ කරන ලද ස්ථාවර තැන්පත් ගිණුම් 07 අවසාන ගිණුම්වල පෙන්වා නැත.

<u>ස්ථාවර තැන්පතු ගි.අ.</u>

20001-90-14730

20001-90-14985

20001-90-15027

20001-90-15051

20001-90-15078

20001-90-15094

20001-90-15892

බැංකුවට භර කරන ලද හඳුනා නොගත් භර ගි.අ.1650

පහත සඳහන් චෙක්පත් දෙකෙහි සඳහන් වටිනාකම් ලංකා බැංකුවේ ආයතන ශාඛාවේ ඇති අංක 1650 දරණ අපගේ ජංගම ගිණුමට භර කර ඇත. ඉහත සඳහන් චෙක්පත් දෙක සොරකම් කර, හොර අත්සන් යොදා බැංකුවට ඉදිරිපත් කර ඇති බැවින් අපි මෙම කරුණ සම්බන්ධයෙන් මිරිහාන පොලිස් ස්ථානයේ වංචා විමර්ශන අංශයට පැමිණිලි කළ අතර ඒ අනුව පොලීසිය විසින් විමර්ශන සිදු කරමින් පවතී.

| චෙක්පත් අංකය | භර කරන ලද දිනය | වටිනාකම රු. |
|---|---|---|
| 239481 | 11.09.2009 | 400,000.00 |
| 239482 | 12.10.2009 | 400,000.00 |

මෙම කරුණු සම්බන්ධයෙන් කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ විභාගවීමට නියමිත නඩුවක් ද පවතී.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } වයිඑස්/ජී/එස්එල්බීඑෆ්ඊ/ 1/13/57

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2015 මාර්තු 12 දින.

සභාපති,
ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය.

**ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශයේ සහ එහි පරිපාලිත සමාගමේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශයේ හා එහි පරිපාලිත සමාගමේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශ පනතේ 18(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කාර්යාංශයේ සභාපති වෙත 2014 නොවැම්බර් 19 දින නිකුත් කරන ලදී.

### 1.2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා(4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---

## 2.1 තත්ත්වාගණනය කළ මතය - කාර්යාංශය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### තත්ත්වාගණනය කළ මතය - සමූහය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශයේ සහ එහි පරිපාලිත සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 96/1019/107/028 මගින් ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය යටතේ සීමිත වගකීම් සහිත අනුශාංගික සමාගමක් පිහිටුවීම සඳහා 1996 අප්‍රේල් 18 දිනැති සංදේශය සලකා බලා රු.දශ ලක්ෂ 5ක ගෙවානිමි ප්‍රාග්ධනයක් සහිතව සීමිත වගකීමක් සහිත අනුශාංගික සමාගමක් පිහිටුවීමට 1996 මැයි 29 දින අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. ඒ අනුව 1996 ඔක්තෝබර් 06 දින ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති නියෝජිත (පෞද්ගලික) සමාගම, එහි සම්පූර්ණ අනුදත් ප්‍රාග්ධනය වූ රු.මිලියන 100 න්, නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය වූ රු.5,000,040 න් රු.මිලියන 5 ක් කාර්යාංශයේ ආයෝජනයන් වශයෙන් ලබාගෙන සංස්ථාපනය කර තිබුණි.

එම පරිපාලිත සමාගමෙන් 2009 වර්ෂයට පසු ප්‍රකාශිත ලාභාංශයෙන් කිසිදු ලාභාංශයක් ලැබී නොතිබුණු අතර 2013 දෙසැම්බර් 31 දිනට රු.3,510,073 ක ලාභාංශයක් ලැබිය යුතුව තිබුණි.

### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ට අනුව, දේපල පිරියත හා උපකරණ ක්ෂය කිරීමේදී වාර්ෂිකව වත්කම්වල ඵලදායී ජීවිත කාලය කලින් ඇස්තමේන්තු කර ක්ෂය අනුපාත හා ක්ෂය ක්‍රමයන් වෙනස් කළ යුතු වුවත්, එසේ වාර්ෂිකව ක්ෂය අනුපාත ඇස්තමේන්තු කර නොමැති බැවින් වාහන 21කට අදාළ ශුද්ධ අගය රු.500 ක් ලෙස ඉතා අඩු වටිනාකමකට පොත්වල පෙන්වා තිබුණි.

ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 යටතේ, නිශ්චිත කාලයකට වරක් වත්කම්වල හානිකරණ තත්වයක් පෙන්වයි නම් එම වත්කම්වල පොත්වල අගය හා වෙළඳපල අගය සන්සන්දනය කර පොත්වල අගය වෙළඳපල අගයට වඩා අඩු නම් එම වෙනස් ප්‍රමාණය කපා හැරීම සිදු කළ යුතු වුවත් එවැනි අගයන් සන්සන්දනය කිරීමක් හෝ ගැලපීමක් සිදු කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේ සමෘද්ධි අධිකාරිය වෙත ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීමට ලබාදෙන ලද රු.මිලියන 100 ක් වූ මුදල සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර ලැබිය යුතු මුදලක් ලෙසටද දක්වා නොතිබුණි.

### 2.2.4 නොසැසඳු පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශන හා ඒ සමඟ ඉදිරිපත් කළ උපලේඛන අනුව වත්කම් ගිණුම් 05 ක හා වගකීම් ගිණුම් 04 ක පිළිවෙලින් රු.850,102 හා රු. 56,359,101 වෙනසක් නිරීක්ෂණය විය. මෙම වෙනස්කම් හඳුනාගෙන ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ) මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ඇති පරිදි ගෙවිය යුතු වන්දි අරමුදල රු.2,822,502,845 ක් වුවද එයට අදාළ වත්කම් රු.2,678,226,189 ක් විය. එම අරමුදල හා වත්කම අතර රු.144,276,656 ක වෙනසක් නිරීක්ෂණය විය.

ආ) විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල පවත්වා ගෙන යනු ලබන සුභසාධන අංශවලට අදාළ මුදල් ශේෂය රු. 189,125,330 හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන රු.133,157,923 ක් වූ ශේෂය අතර රු.55,967,407 ක වෙනසක් නිරීක්ෂණය විය. එම වෙනස සඳහා කාර්යාංශය විසින් පැහැදිලි කිරීමක් ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම්

විගණනය සඳහා ඉදිරිපත් නොකළ සාක්ෂි පහත දැක්වෙන පරිදි විය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| i. කොරියන් ටිකට් තැන්පතු ගාස්තු | 134,541,914 | උපලේඛන හා තහවුරු කිරීම් ලේඛන |
| ii. කොරියන් වීසා තැන්පතු ගාස්තු | 31,707,119 | |
| iii. කොරියන් තාක්ෂණික පුහුණු සඳහා ලබාදෙන ලද ණය | 4,563,693 | |
| iv. කොරියාවට නැවත පිටත්වීමේ ගාස්තු | 514,888 | |
| iv. ලියාපදිංචි ගාස්තු පෙර ගෙවුම් | 13,551,066 | |
| vi. ලැබිය යුතු ගුවන් ටිකට්පත් ගාස්තු | 787,274 | |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ) 2003 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා විදේශ දූත මණ්ඩල සුභසාධන අංශ විසින් අයකර මහා භාණ්ඩාගාරය හරහා කාර්යාංශයට ප්‍රේෂණ කරනු ලැබූ එකතුව රු.2,622,815,725 ක් වූ කම්කරු කොන්ත්‍රාත් ගිවිසුම් ගාස්තුවලින් රු.1,262,267,079 ක් පමණක් කාර්යාංශය වෙත ලැබී තිබුණු අතර රු.1,360,548,646 ක මුදලක් ලැබිය යුතුව තිබුණි.

ආ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ආපසු ගෙවිය යුතු රු.1,038,205 ක් වූ ටෙන්ඩර් තැන්පතු ශේෂයේ වර්ෂ 02 ඉක්මවූ රු. 583,681 ක ශේෂයන් වූ අතර එම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

ඇ) විදේශ රැකියා නියෝජිත ආයතන වලින් සමාලෝචිත වර්ෂය අවසානයට අයකර ගත යුතුව පැවති රු.2,873,500 ක සෙස් බදු වලින් නියෝජිත ආයතන 120 කට අදාළ රු.368,750 ක මුදලක් 2014 සැප්තැම්බර් වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| අ) 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශ පනත 15වන වගන්තිය | ශ්‍රී ලාංකිකයින් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්ති අවස්ථා නංවාලීම සහ සංවර්ධනය කිරීම, විශේෂිත පුහුණු අවස්ථා සැලසීම, විගමනික ශ්‍රමිකයින් හා ඔවුන්ගේ පවුල්වල සමාජිකයින්ගේ ආරක්ෂාව හා සුභසාධනය සැපයීම සඳහා කටයුතු සැලසීම අරමුණ වුවත්, ඊට පටහැනිව අරමුණුගත නොවූ ටැලන්ට් ස්ටාර් ව්‍යාපෘතිය වෙනුවෙන් රු.101,613,470 ක මුදලක් වැය කර තිබුණි. |

ආ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 5(1) වගන්තිය සහ 6(2) වගන්තිය

වර්ෂ 5ක සේවා කාලයක් සම්පූර්ණ කර සේවයෙන් ඉවත්වන සේවකයෙකුට සේවය අවසන් කළ දින සිට දින තිහක් (30) ඇතුළත ගණන් බලන ලද පාරිතෝෂිකයක් ගෙවිය යුතු වුවද, කාර්යාංශය විසින් සේවය අවසන් කළ සේවකයින් 19 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දී පාරිතෝෂික මුදල් ගෙවීමේ දී දින 75 සිට 1654 ක කාල ප්‍රමාදයක් සිදු වී තිබුණි.

ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

i. මුදල් රෙගුලාසි 371(2) ඇ ඡේදය

අත්තිකාරම් අදාළ කාර්යය නිම කළ විගස පියවිය යුතු වුවත්, අවස්ථා 18 කදී ලබා ගන්නා ලද රු.238,183 ක අත්තිකාරම් මුදල් වසර 09 කට වඩා වැඩි කාලයක් පියවීමට කටයුතු කර නොතිබුණි.

ii. මුදල් රෙගුලාසි 395 (ඇ)

එක් එක් මාසය අවසානයේ ඇති ගනුදෙනු සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයන් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුවුවත්, කාර්යාංශයේ ජංගම ගිණුම් 15 ක් හා විදේශ තානාපති කාර්යාලවල පවත්වා ගෙන යනු ලබන කාර්යාංශයේ කම්කරු සුභසාධන අංශවල බැංකු ජංගම ගිණුම් 17 කට අදාළ සැසඳුම් ප්‍රකාශයන් 32 ක් මාසක් හා මාස 03 ක් අතර කාල ප්‍රමාදයක් සහිතව පිළියෙල කර ඉදිරිපත් කර තිබුණි.

iii.මුදල් රෙගුලාසි 756

විදේශ තානාපති කාර්යාලවල පවත්වා ගෙන යනු ලබන කාර්යාංශයේ කම්කරු සුභසාධන අංශ 12 ක්, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

ඈ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2.11 ඡේදය

මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ වාහන 117 ක් සඳහා ඉන්ධන රු.27,333,369 ක් වැය කර තිබුනද එවැනි පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.

ඉ) 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

| | |
|---|---|
| (i) 5.4.12 වගන්තිය | වැට් බදු ආවරණය කිරීම සඳහා මුදල් ගෙවීමෙන් පසු ඊළඟ මාසයේ 15 වන දින හෝ එදිනට පෙර එකී ගෙවීම් පිළිබඳ විස්තර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) 1.2.1 වගන්ති | ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සහතික වියයුතු වූ කරුණු සම්බන්ධයෙන් ප්‍රසම්පාදන අස්ථිත්වය අවධානය යොමු නොකර පෞද්ගලික ඉංජිනේරු සේවා සමාගමකට අයත් ඉඩමක් 99 අවුරුදු බදු පදනම මත ලබා ගෙන ඒ සඳහා රු.මිලියන 20 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. |
| (iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොත අංක 19 | රු.200,000 ට වැඩි අළුත්වැඩියා වියදම් සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අවස්ථා 09 කදී රු.4,927,672 ක අළුත්වැඩියා සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

---

ජපන් තානාපති කාර්යාලයේ කම්කරු සුභසාධන අංශයට කම්කරු සුභසාධන නිලධාරි තනතුරක් අනුමත කර නොතිබූ අතර 2012 වර්ෂයේ හා 2013 වර්ෂයේ අනුමත නොවූ තනතුරක් සඳහා පිළිවෙලින් රු.5,103,405 ක් හා රු.3,483,992 ක් වැටුප් හා දීමනා ගෙවා තිබුණි.කාර්යාංශය විසින් ලබා දෙන ලද පිළිතුරට අනුව ජපානයේ රැකියා කරන ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් සම්බන්ධයෙන් ගැටළු නොමැති බවත් ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් සඳහා රැකියා අවස්ථා ප්‍රවර්ධනය එම නිලධාරියාගේ කාර්යභාරය වන බවත් සුභසාධන කටයුතු අවම මට්ටමක පවතින බැවින් එම නිලධාරියාගේ වැටුප් හා දීමනා ගෙවීම් පමණක් සිදු කරන බව දක්වා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1. මූල්‍ය ප්‍රතිඵල

---

සමාලෝචිත වර්ෂයේ කාර්යාංශයේ සහ එහි පරිපාලිත සමාගමේ ක්‍රියාකාරකම්වලින් ආදායම් බදුවලට පෙර අතිරික්තය රු.326,198,141ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.258,895,523 ක අතිරික්තයක් වුයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.67,302,618ක් හෙවත් සියයට 26 වර්ධනයක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී ආදායමේ වැඩිවීම වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි.

කාර්යාංශයට එරෙහිව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට බාහිර පාර්ශවයන් විසින් නඩු 15 ක් ගොනු කර තිබුණු අතර කාර්යාංශය විසින් බාහිර පාර්ශවයන් වෙතත් එක් නඩුවක් පවරා තිබුණි.

4 මෙහෙයුම් සමාලෝචනය.

4.1 කාර්යසාධනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) කාර්යාංශයට අයත් ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන 18 ට අමතරව පෞද්ගලික පුහුණු මධ්‍යස්ථාන 11 ක් මඟින් විගමනික ශ්‍රමිකයින් පුහුණු කිරීම සිදු කරනු ලබන අතර පෞද්ගලික පුහුණු මධ්‍යස්ථානවල පුහුණු කිරීම් හා පුහුණුලාභීන් වෙත සලසනු ලබන සේවාවන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් අධීක්ෂණයක් හා පරිපාලනයක් කාර්යාංශය විසින් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය.

ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්මට අනුව ඉලක්කගත කාර්යයසාධන මට්ටම සම්පූර්ණයෙන්ම ඉටුකර නොතිබුණු විෂයයන් 13 ක් සහ කාර්යයසාධනය දුර්වල මට්ටමක පැවති විෂයයන් 25 ක් විය.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ) විධිමත් විනය පරීක්ෂණයකින් පසු සේවයෙන් පහ කරනු ලැබූ කාර්යාංශ නිලධාරියකු විනය පරීක්ෂණ නියෝග නොසලකා හැර නැවත සේවයේ පිහිටුවා තිබුණද, 2014 පෙබරවාරි 12 දින නැවත වරක් සේවයේ පිහිටුවීම අවලංගු කර තිබූ අතර 2013 ජූලි සිට 2014 ජනවාරි මාසය දක්වා වැටුප් හා දීමනා වශයෙන් රු.152,960 ක මුදලක් ගෙවා තිබුණි.

ආ) කාර්යාංශය විසින් ප්‍රසාද දීමනා ගෙවීමේදී, වර්ෂය තුළ වැටුප් රහිත නිවාඩු 10 ක් හෝ ඊට වැඩියෙන් ලබා ගන්නා ලද නිලධාරීන්ට ප්‍රසාද දීමනා සඳහා හිමිකම් නොමැති වුවත් ඊට පටහැනිව කාර්යාංශයේ පද්ධති විශ්ලේෂක වශයෙන් සේවයේ නියුක්තව සිට 2007 දෙසැම්බර් 24 දින සිට වැටුප් රහිත නිවාඩු ලබා ඇති නිලධාරියෙකු වෙත 2007 වර්ෂයේ වැටුප් රහිත නිවාඩු 11 ½ ලබාගෙන තිබියදී රු.51,875 ක් ප්‍රසාද දීමනා ලෙස ගෙවා තිබුණි. නිලධාරියාගෙන් එම මුදල් කාර්යාංශය වෙත අයකර ගැනීමට විගණන දින වන 2014 මැයි 12 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

ඇ) ඉහත පද්ධති විශ්ලේෂක විසින් අවස්ථා කිහිපයකදී ලබා ගන්නා ලද වැටුප් රහිත නිවාඩු කාල සීමාවට අදාළව කාර්යාංශය හා නිලධාරියා එළැඹි ගිවිසුම් ප්‍රකාරව සේවය කළ යුතු වූ අවම සේවා කාලය සේවා නොකිරීම හේතුවෙන් අයවිය යුතු රු.866,828 ක දණ්ඩන මුදල අයකර ගැනීමට කාර්යාංශය විසින් 2014 මැයි 12 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

ඈ) සමාලෝචිත වර්ෂය අවසාන් වන විට විගමනිකයින්ගේ පැමිණිලි / ආරවුල් සමථයකට පත්කර ගැනීම සඳහා නියෝජිත ආයතන විසින්, සමාලෝචිත වර්ෂයේ සහ වර්ෂ 05 ක කාලපරිච්ඡේදයක් තුළ තැන්පත් කර තිබූ මුදල්වල, එකතුව රු.17,465,688 ක් වූ අතර, තැන්පතු මුදලින් නිරවුල් නොකළ ශේෂයන් නිරවුල් කිරීමට 2014 සැප්තැම්බර් වන විටත් කටයුතු කර නොතිබුණි.

ඉ) විගමනික ශ්‍රමිකයන් සඳහා අර්ථ සාධක අරමුදල් යෝජනා ක්‍රමයක් කාර්යාංශය විසින් 1989 සිට 1996 වර්ෂය දක්වා පවත්වා ගෙන ගොස් තිබූ අතර දායක මුදල් ලෙස විගමනිකයින් ගෙවනු ලබන මුදලින් සියයට 60 ක් අදාළ ශ්‍රමිකයා වෙනුවෙන් සේවානියුක්තිකයින්ගේ භාර අරමුදල් මණ්ඩලයේ තැන්පත් කර ඉතිරිය කාර්යාංශය විසින් රඳවා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කාර්යාංශය විසින් රඳවා ගෙන තිබූ මුදල රු.6,110,128ක් විය.අදාළ අර්ථ සාධක අරමුදල් ක්‍රමය වර්තමානයේ අක්‍රිය තත්වයේ පැවති අතර කාර්යාංශය විසින් විගමනිකයින් 1620 කට අයත් එම මුදල් ඔවුන් වෙත මුදාහැරීමකින් තොරව රඳවා ගෙන තිබුණි.

ඊ) 1990 වර්ෂයේ දී ඉරාකය විසින් කුවේට් ආක්‍රමණය කිරීමෙන් එහි රැකියාවන්හි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ට සිදු වූ ආපදාවන්ට වන්දි ගෙවීම සඳහා එක්සත් ජාතීන්ගේ වන්දි කොමිසමෙන් ලැබුණු මුදලින් ඉතිරි වූ රු.2,822,502,845 ක මුදල අදාළ ශ්‍රමිකයින් වෙත ගෙවා අවසන් කිරීමට විධිමත් වැඩපිළිවෙලක් කාර්යාංශය විසින් ගෙන නොතිබුණි.

උ) 2009 සිට 2013 දක්වා රක්ෂණ වන්දි ලෙස රක්ෂණ ආයතනයෙන් ලද මුදලින් රු.3,474,174ක මුදලක් අදාළ විගමනික ශ්‍රමිකයින්ට ගෙවීමට කටයුතු නොකර ණයහිමියන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ) කාර්යාංශය විසින් තැන්පත් කර තිබූ රු.1,210,968 ක් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එම මුදල ආපසු අයකර ගැනීම සම්බන්ධව කිසිදු පසු විපරමක් කර නොතිබුණි.

ආ) ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සියේ මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව විගමනික ශ්‍රමිකයින් 32 දෙනෙකු වෙත ගෙවිය යුතු වූ රු.9,813,000 ක මරණ වන්දි වලින් 11 දෙනෙකු සඳහා ගෙවිය යුතු වූ රු.3,465,000 ක මුදල සඳහා රක්ෂණ වන්දි මුදල් ලැබී ඇතත්, කාර්යාංශය විසින් විගණිත දින වූ 2014 සැප්තැම්බර් 12 දින වනවිටත් වසරක කාලයක් ඉක්මවා ඇතත් එම මුදල් අදාළ වන්දි හිමියන්ට නිදහස් කිරීමට විධිමත් පියවර ගෙන නොතිබුණි.

ඇ) වාහන ණය ලේඛනය යාවත්කාලීන කර නොතිබූ අතර නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. නිලධාරීන් තිදෙනෙකු වෙත ගෙවන ලද වාහන ණය රු.1,049,000 ක් වාහන ණය ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

ii. අලුතින් ලබාදෙන ණය ඇතුළත් නොකිරීම හා අයකරන ලද ණය මුදල් නිසි පරිදි ලේඛනගත නොකිරීම නිසා නිලධාරියෙකුගේ රු. 372,000 ක ණය ශේෂය රු.87,360 ක් ලෙස ණය ලේඛනයේ දක්වා තිබුණි.

ඇ) නිලධාරින් 38 දෙනෙකු විසින් ලබා ගෙන තිබූ රු.5,625,164 ක් වූ උත්සව, ක්ෂණික , ආපදා සහ වාහන ණය මුදල් හා රු.512,009 ක පොළී මුදල ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

ඉ) නිලධාරියෙකු විසින් ලබා ගත් අත්තිකාරම් නොපියවා තිබිය දී අවස්ථා 09 ක දී නැවත අත්තිකාරම් මුදල් ලෙස රු. 3,184,340 ක මුදලක් එම නිලධාරියාටම ලබා දී තිබූ බව නිරීක්ෂණය විය.

## 4.4 ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ) තංගල්ල පුහුණු මධ්‍යස්ථානයේ තට්ටු ඇඳන් 100 ක් සඳහා මදුරු දැල් 200 ක් ඇණවුම් කර ලබාගෙන තිබුණි. එක් මදුරු දැලක් එක්තට්ටු ඇඳක් සඳහා ප්‍රමාණවත් වූ බැවින් අවශ්‍යතාව ඉක්මවා මදුරු දැල් 100 ක් ඇණවුම් කිරීම හේතුවෙන් රු.245,000 ක් වටිනා මදුරු දැල් ප්‍රයෝජනයට නොගෙන ගබඩා කර තිබුණි.

ආ) කාර්යාංශය විසින් සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි විගමනික පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව කතරගම, රත්නපුර, හාලිඇළ, හෝමාගම සහ දඹුල්ල විගමනික සම්පත් මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා 2007 වර්ෂයේ සිට 2013 ජූලි මස දක්වා කාල සීමාව තුළදී රු.57,272,816 ක මුදලක් වැය කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය තෙක් එම ඉදිකිරීම් ව්‍යාපෘතිවල වැඩ අවසන් කර නොතිබූ බැවින් මධ්‍යස්ථාන ප්‍රයෝජනයට ගත නොහැකි විය.

## 4.5 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ) 2011 හා 2012 වර්ෂවලට අදාළව ජාතික රක්ෂණ අරමුදල් භාරයට හා ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති නියෝජිත ආයතනය වෙත රක්ෂණ වාරික ලෙස ගෙවා තිබූ රු.218,681,760 ක මුදලෙහි ඇතුළත රු.23,430,210 ක් යෙදවුම් බදු මුදල් බදු ගෙවීම් ගණනය කිරීමේදී හිලව් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ආ) 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ගුවන් තොටුපළ ඒකකය මගින් විගමනිකයින් 146 ක් කාර්යාංශයේ ලියාපදිංචි කිරීමේදී රු.822,894 ක මුදලක් විගමනිකයන්ගෙන් අයකරගෙන නොතිබුණි.

ඇ) බැංකු ගිණුමකට ලියාපදිංචි ගාස්තු ලෙස 2007 වර්ෂයේ තැන්පත් කරන ලද රු.12,260 ක් වූ උපලබ්ධි නොවූ තැන්පතු අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි විධිමත් පරීක්ෂණයකින් තොරව කපා හැර තිබුණි.

ඈ) ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය විසින් 2009 ජනවාරි, අප්‍රේල් , 2010 සැප්තැම්බර් සහ 2013 පෙබරවාරි මාසයන්හි සේවානියුක්ති භාර අරමුදලේ දායක මුදල් යාවත්කාලීනව නොගෙවීම හේතුවෙන් රු.5,986 ක අධිභාර මුදලක් ගෙවා තිබුණි.

## 4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් කාර්යාංශයේ සම්පත්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව කාර්යාංශයට අයත් හා කුළී පදනම මත ලබා ගන්නා ලද වාහන 03 ක් අදාළ අමාත්‍යාංශය හා වෙනත් රජයේ ආයතන විසින් පාවිච්චි කරමින් තිබුණි. ඒ සඳහා කාර්යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී රු.2,229,874 ක් ඉන්ධන හා කුළී ගෙවා තිබුණි.

ආ) කාර්යාංශයේ නිලධාරින් 10 දෙනෙකු අමාත්‍යාංශයේ හා රජයේ අනෙකුත් ආයතනවල සේවයේ යොදවා තිබුණු අතර 2013 හා 2014 ජුනි දක්වා පිළිවෙලින් රු. 5,425,814 ක් හා රු.2,527,220 ක මුදලක් වැටුප් හා වේතන ලෙස ගෙවා තිබුණි.

## 4.7 අනාර්ථික ගනුදෙනු

බදුල්ල දිස්ත්‍රික්කයේ හාලි ඇළ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ අක්කරයක භූමි ප්‍රමාණයක් රු.මිලියන 20 කට මිලදී ගැනීමෙන් පසු ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 594 ක වියදමින් තට්ටු 06 ක විගමනික සම්පත් මධ්‍යස්ථානයක් ඉදිකිරීමට සැලසුම් සකස් කර ඇති අවස්ථාවක බදුල්ල දිස්ත්‍රික්කයේ හපුතලේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ නැවත පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 99 අවුරුදු බදු පදනම මත රු.මිලියන 84 ක මුදලකට ඉඩමක් මිලදී ගැනීමට කටයුතු කිරීම අනාර්ථික ගනුදෙනුවක් බවට නිරීක්ෂණය විය.

## 4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

2013 දෙසැම්බර් 31 දිනට කාර්යාංශයට අදාළව කාර්ය මණ්ඩල විස්තර පහත සඳහන් පරිදි වේ.

අ) 2013 දෙසැම්බර් 31 දිනට කාර්යාංශයේ තනතුරු 24 ක් සඳහා 892 ක ස්ථිර කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබුණද තථ්‍ය ස්ථිර කාර්ය මණ්ඩලය 821 ක් වීමෙන් 71 ක පුරප්පාඩු නිරීක්ෂණය විය.

ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/E4/46/4/274/1 හා 2010 සැප්තැම්බර් 06 දිනැති කාර්ය මණ්ඩල අනුමත කිරීම් ලිපිය මගින් කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනාවට කාර්යාංශයේ තනතුරු 24 ක් සඳහා 892 ක කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබුණි. එහෙත් ඉහත දැක්වෙන පරිදි අනුමත කාර්ය

මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට කටයුතු සිදු නොකර අනුමත හා පුරප්පාඩු ප්‍රමාණයද ඉක්මවා කොන්ත්‍රාත්, ද්විතික හා කාර්යය පදනම මත පිළිවෙලින් 248, 16 හා 03 දෙනෙකු සේවයේ යොදවාගෙන තිබුණි.

ඇ) අනුමත නොවූ තනතුරු 09 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 22 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර ඒ සඳහා රු.9,069,532 ක මුදලක් 2013 වර්ෂය තුළදී වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

## 4.9 වාහන උපයෝජනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ) නිලධාරීන් 18 දෙනෙකු විසින් 2013 මාර්තු සිට දෙසැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළව අනුමත සීමාව ඉක්මවා ලබාගන්නා ලද රු.2,204,131 ක් වූ ඉන්ධන ලීටර් 13632.75 ක් සඳහා අදාළ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

ආ) කාර්යාංශය විසින් 1999 නොවැම්බර් 12 වැනි දින රු.2,075,000 කට මිලදී ගන්නා ලද ඉසුසු ටූපර් ජීප් රථයක් සඳහා 1999 නොවැම්බර් සිට 2013 අගෝස්තු හෝ ඊට ආසන්න කාල සීමාව සඳහා කිලෝ මීටර් 174,142 ක් ධාවනය කර තිබුණි. එම කාල සීමාවට අදාළව සමස්ථ අලුත්වැඩියා වියදම රු.6,682,144 ක් වූ අතර වාහනයේ පිරිවැය මෙන් තුන් ගුණයකට ආසන්න මුදලක් අළුත්වැඩියාව සඳහා වැයකර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

කාර්යාංශය විසින් 2011 - 2015 කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය අනුව, සංයුක්ත සැලැස්මේ කාර්යයන් ඉටු කිරීම පිළිබඳ ප්‍රගතිය හා ක්‍රියාත්මක නොවුණු හා මන්දගාමී අංශ පිළිබඳ ඇගයීමක් කර ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් පිළියෙල කර නොතිබුණ අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයටද ලක්කර නොතිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ) කාර්යාංශයේ ඇස්තමේන්තුගත වියදම හා තථ්‍ය වියදම අතර සියයට 11 ත් සියයට 629 ත් අතර විචලනයන් වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

ආ) සේවක සුභසාධක අරමුදලේ ඇස්තමේන්තුගත වියදම් හා සත්‍ය වියදම් අතර සියයට 33 ත් සියයට 100 ත් අතර විචලනයක් පැවති බැවින් එම අරමුදලින් ප්‍රමාණවත් සුභසාධන කටයුතු ඉටුකිරීම පිළිබඳ විගණනයට සෑහීමකට පත්වීමට නොහැකි විය.

5.3 විගණන හා කළමනාකරණ කමිටු

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් පවත්වා තිබූ නමුත් එමඟින් ගෙන තිබූ තීරණ අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය සඳහා යොමුකර නොතිබූ බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කාර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී.පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමු කළයුතු වේ.

අ) ගිණුම්කරණය.
ආ) වාහන පරිපාලනය.
ඇ) විදේශ දූත මණ්ඩල මඟින් උපයන ආදායම් හා සේවා සැපයුම්.
ඈ) විදේශ රැකියා නියෝජිත ආයතනවල කටයුතු.
ඉ) වත්කම් උපයෝජනය.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩ බලන)

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ එහි පරිපාලිත සමාගමේ 2013 දෙසැම්බර් 31 දිනෙන්අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සභාපති තුමාගේ නිරීක්ෂණ හා පැහැදිළි කිරීම.

| විගණකාධිපති වාර්තාව | සභාපතිතුමාගේ නිරීක්ෂණයන් |
|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම<br>**2.2.1** ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන<br>අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 96/1019/107/028 මඟින් ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය යටතේ සීමිත වගකීම් සහිත අනුශාංගික සමාගමක් පිහිටුවීම සඳහා1996 අප්‍රේල් 18 දිනැති සංදේශය සලකා බලා රු.දශ ලක්ෂ 5ක ගෙවානිමි ප්‍රාග්ධනයක් සහිතව සීමිත වගකීමක් සහිත අනුශාංගික සමාගමක් පිහිටුවීමට 1996 මැයි 29 දින අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි.ඒ අනුව,1996 ඔක්තොම්බර් 06 දින ශ්‍රී ලංකා විදේශ සේවා නියෝජිත (පෞද්ගලික) සමාගම ,එහි සම්පූර්ණ අනුදත් ප්‍රාග්ධනය වූ රුපියල් මිලියන 100 න්,නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය වූ රු.5,000,040 න් රු.මිලියන 5ක් කාර්යාංශයේ ආයෝජනයන් වශයෙන් ලබාගෙන සංස්ථාපනය කර තිබුණි. | |
| එම පරිපාලිත සමාගමෙන් 2009 වර්ෂයට පසු ප්‍රකාශිත ලාභාංශයෙන් කිසිදු ලාභාංශයක් ලැබී නොතිබුණු අතර 2013 දෙසැම්බර් 31 දිනට රු.3,510,073 ක ලාභාංශයක් ලැබිය යුතුව තිබුණි. | පරිපාලිත සමාගමේ 2010,2011 සහ 2012 වර්ෂයන් සඳහා ලාභාංශ ප්‍රකාශයට පත්කර නොමැත.<br>හිඟ ලාභාංශ ඉල්ලා කාර්යාංශය විසින් පරිපාලිත සමාගම වෙත ඉල්ලීම් ඉදිරිපත් කොට ඇත. |
| **2.2.2** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති<br>පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | |
| අ) ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 16 ට අනුව ,දේපල පිරියත හා උපකරණ ක්ෂය කිරීමේදී වාර්ෂිකව වත්කම්වල ඵලදායී ජීවිත කාලය කලින් ඇස්තමේන්තු කර ක්ෂය අනුපාත හා ක්ෂය ක්‍රමයන් වෙනස් කළ යුතු වුවත්,එසේ වාර්ෂිකව ක්ෂය අනුපාත ඇස්තමේන්තු කර නොමැති බැවින් වාහන 21 කට අදාළ ශුද්ධ අගය රු.500 ක් ලෙස ඉතා අඩු වටිනාකමකට පොත් වල පෙන්වා තිබුණි. | වත්කම්වල ශුද්ධ අගය ඉතා අඩු වටිනාකමකට දක්වා තිබූ මෝටර් වාහනවල අගය යළි ඇස්තමේන්තු කර ගිණුම් වල දැක්වීමට පියවර ගනු ලැබේ. |
| ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 යටතේ, නිශ්චිත කාලයකට වරක් වත්කම්වල හානිකරණ තත්වය තත්වය පෙන්වයි නම් එම වත්කම්වල පොත්වල අගය හා වෙළඳපල අගය හා වෙළඳපල අගය සන්සන්දනය කර පොත්වල අගය වෙළඳපල අගයට වඩා අඩු නම් එම වෙනස් ප්‍රමාණය කපා හැරීම සිදු කළ යුතු වුවත් එවැනි අගයන් සන්සන්දනය කිරීමක් හෝ ගැළපීමක් සිදු කර නොතිබුණි. | ඉදිරියේදී මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී මෙම ප්‍රමිතිය අනුව වත්කම් හානිකරණය සඳහා කළ යුතු ගැලපිලි සිදු කිරීමට සටහන් කරගෙන ඇත. |
| **2.2.3** ගිණුම්කරණ අඩුපාඩු<br>සමාලෝචිත වර්ෂයේ සමෘද්ධි අධිකාරිය වෙත ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීමට ලබාදෙන ලද රු.මිලියන 100 ක් වූ මුදල සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර ලැබිය යුතු මුදලක් ලෙසට ද දක්වා නොතිබුණි. | රු.මිලියන 100 ක ස්ථාවර තැන්පත් මුදල කාර්යාංශයේ ආයෝජනයක් ලෙස ස්ථාවර තැන්පත් යටතේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇත. |

| | |
|---|---|
| **2.2.4 නොසැසඳූ පාලන ගිණුම්**<br><br>මූල්‍ය ප්‍රකාශන හා ඒ සමඟ ඉදිරිපත් කළ උපලේඛන අනුව වත්කම් ගිණුම් 05 ක හා වගකීම් ගිණුම් 04 ක පිළිවෙලින් රු.850,102 හා රු.56,359,101 වෙනසක් නිරීක්ෂණය විය.මෙම වෙනස්කම් හඳුනාගෙන ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වෙනස්කම් හඳුනාගෙන අවශ්‍ය ගිණුම් ගැළපිලි සිදු කිරීමට කටයුතු කෙරෙමින් පවතී. |
| **2.2.5 පැහැදිළි නොකළ වෙනස්කම්**<br><br>පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | |
| අ) මූල්‍ය ප්‍රකාශන්හි දක්වා ඇති පරිදි ගෙවිය යුතු වන්දි අරමුදල රු.2,822,502,845 ක් වුවද එයට අදාළ වත්කම් රු.2,678,226,189 ක් විය.එම අරමුදල හා වත්කම අතර රු.144,276,656 ක වෙනසක් නිරීක්ෂණය විය. | කුවේට් වන්දි අරමුදල් ගිණුමෙහි මුදල් භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජනය කිරීම තුළින් ලද පොළී මුදල් බැංකු විසින් සෘජුවම කාර්යාංශ ගිණුම් වලට බැර කර තිබීම මෙම වෙනසට හේතුව බව හඳුනාගෙන ඇත. |
| ආ) විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල පවත්වා ගෙන යනු ලබන සුභසාධක අංශවලට අදාළ මුදල් ශේෂය රු. 189,125,330 හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන රු.133,157,923 ක් වූ අතර ශේෂය රු.55,967,407 ක වෙනසක් නිරීක්ෂණය විය.එම වෙනස සඳහා කාර්යාංශය විසින් පැහැදිළි කිරීමක් ඉදිරිපත් කර නොතිබුණි. | රුපියල් 51,197,787.99 වෙනස්කම් නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ගිණුම් ගැලපිලි 2014 වර්ෂයේ සිදුකර ඇත.ඉතිරි මුදල අනාවරණය කරගෙන අවශ්‍ය ගිණුම් ගැලපිලි සිදු කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. |
| **2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**<br><br>විගණනය සඳහා ඉදිරිපත් නොකළ සාක්ෂි පහත දැක්වෙන පරිදි විය. | මෙම උපලේඛන ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී |

| විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| I. කොරියන් ටිකට් තැන්පතු ගාස්තු | 134,541,914 | උපලේඛන හා තහවුරු කිරීමේ ලේඛණ |
| II. කොරියන් වීසා තැන්පතු ගාස්තු | 31,707,119 | |
| III. කොරියන් තාක්ෂණික පුහුණු සඳහා ලබාදෙන ණය | 4,563,693 | |
| IV කොරියාවට නැවත පිටත් වීමේ ගාස්තු | 514,888 | |
| V ලියාපදිංචි ගාස්තු පෙර ගෙවුම් | 13,551,066 | |
| VI ලැබිය යුතු ගුවන් ටිකට්පත් ගාස්තු | 787,274 | |

| | |
|---|---|
| **2.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>**<br>පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | |
| (අ) 2003 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා විදේශ දූත මණ්ඩල අංශ විසින් අයකර මහා භාණ්ඩාගාරය හරහා කාර්යාංශයට ප්‍රේෂණ කරනු ලැබූ එකතුව රු.2,622,815,725 ක්වූ කම්කරු කොන්ත්‍රාත් තිවිසුම් ගාස්තු වලින් රු.1,262,267,079 පමණක් කාර්යාංශය වෙත ලැබී තිබුණු අතර රු.1,360,548,646 ක මුදලක් ලැබිය යුතුව තිබුණි. | මෙම මුදල් ඉල්ලා අප විසින් නිරන්තරයෙන් ම ඉල්ලීම් ඉදිරිපත් කර ඇතත් මහාභාණ්ඩාගාරය විසින් අදාළ අරමුදල් නිදහස් නොකිරීම නිසා මෙම මුදල තවදුරටත් ලැබිය යුතු ණය මුදලක් මුදලක් ලෙස පෙන්වා ඇත.කාර්යාංශය වෙත ලැබිය යුතු මුදලින් රුපියල් මිලියන 175 ක මුදලක් 2014 වර්ෂය තුළදී ලැබී ඇත.<br><br>ඉදිරි වර්ෂවලදී වර්ෂයකට රු.මිලියන 175 බැගින් අමාත්‍යාංශ ඇස්තමේන්තුවලට ඇතුළත් කර ලබා දීමට භාණ්ඩාගාරය එකඟ වී ඇත. |
| (ආ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ආපසු ගෙවිය යුතු රු.1,038,205 ක් වූ ටෙන්ඩර් තැන්පතු ශේෂයේ වර්ෂ 02 ඉක්මවූ රු.583,681 ක ශේෂයන් වූ අතර එම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල් පිළිබඳව තැන්පත්කරුවන් දැනුවත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගනු ලැබේ. |
| ඇ) විදේශ රැකියා නියෝජිත ආයතන වලින් සමාලෝචිත වර්ෂය අවසානයට අයකර ගත යුතුව පැවති රු.2,873,500 ක සෙස් බදු වලින් නියෝජිත ආයතන 120 කට අදාළ රු.368,750 ක මුදලක් 2014 සැප්තැම්බර් වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රැකියා නියෝජිතායතනය විසින් විසින් ඉදිරිපත් කරනු ලබන 70% හිමිකම් ඉල්ලීම් වලින් මෙම මුදල් අයකරනු ලබන අතර එම ඉල්ලීම් කාර්යාංශය වෙත ඉදිරිපත් කරන තෙක් එම මුදල් අය කර ගැනීමේ ගැටළුවක් පවතී.මෙම රු.368,750/= ක මුදලින් රුපියල් 40,000/= ක මුදලක් මේ වන විට අයකරගෙන ඇත.ඉතිරි මුදල් වන රුපියල් 328,750/= ක මුදල ද අය කර ගැනීමට පියවර ගනු ලැබේ. |
| **<u>2.4 නීති,රීති ,රෙගුලාසි හා කලමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.</u>**<br><br>පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.<br><br>නීති,රීති,රෙගුලාසි හා කළමණාකරන <u>තීරණවලට යොමුව</u> — <u>අනුකූල නොවීම</u><br><br>අ)1985 අංක 21 දරණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත 15 වන වගන්තිය — ශ්‍රී ලාංකිකයින් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්ති අවස්ථා නංවාලීම සහ සංවර්ධනය කිරීම,විශේෂිත පුහුණු අවස්ථා සැලසීම , විගමණික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ ආරක්ෂාව හා සුභසාධනය සැපයීම සඳහා කටයුතු සැලසීම අරමුණු වුවත් , ඊට පටහැනිව අරමුණුගත නොවූ ටැලන්ට් ස්ටාර් ව්‍යාපෘතිය වෙනුවෙන් රු.101,613,470 ක මුදලක් වැය කර තිබුණි. | විදෙස් රටවල කාර්යාංශයේ ලියාපදිංචිය ඇතිව රැකියා කරන ශ්‍රමිකයින් දක්ෂතා එළි දැක්වීම සඳහා වේදිකාවක් සකස් කිරීම සහ විදෙස්ගතව සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් දේශීය ආර්ථිකය ශක්තිමත් කරන ප්‍රධාන කොටස්කරුවන් ලෙස රටේ සෙසු ප්‍රජාවට හඳුන්වාදීම හා ඔවුන්ගේ අභිමානය වර්ධනය සඳහා සිදු කළ වැඩසටහනක් ලෙස මෙය හඳුන්වා දිය හැකිය.<br>සෑම සතියකම රූපවාහිනී මාධ්‍යක් මඟින් ප්‍රචාරණය වූ වැඩසටහනක් ලෙස රටේ සෙසු ප්‍රජාව ද ඒ සඳහා සම්බන්ධ කරවාගෙන එම වැඩසටහන අතරතුර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අනෙකුත් සේවාවන් සඳහා පුළුල් ප්‍රචාරයක් ලබා දෙමින් මෙම වැඩසටහන පවත්වාගෙන යන ලදී. |

| | | |
|---|---|---|
| | | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පරමාර්ථය ලෙස විගමණික සේවකයින් සඳහා සුභසාධන වැඩසටහනක් සකස් කිරීමේදී පුළුල් අර්ථයකින් එය ක්‍රියාත්මක වේ.එහිදී සුභසාධනය ලෙස අදහස් කරන්නේ හුදු භෞතික සම්පත් ලබා දීම පමණක් ම නොව ඔවුන්ට ද සමාජයේ සෙසු ප්‍රජාව භුක්ති විඳින විවිධ අවස්ථාවන් සම්බන්ධයෙන් අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව ලබා ගැනීමට අවස්ථාව ලබා දීමයි.එනම් ඔවුන් සතු දක්ෂතා තිබේ නම් ඒවා ප්‍රදර්ශනය කිරීමට අවස්ථාවක් ඇති කිරීමයි. |
| (ආ)1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීම් පනතේ 5(1) වගන්තිය සහ 6(2) වගන්තිය | වර්ෂ 5 ක සේවා කාලයක් සම්පූර්ණ කර සේවයෙන් ඉවත්වන සේවකයෙකුට සේවය අවසන් කළ දින සිට දින තිහක් (30) ඇතුළත ගණන් බලන ලද පාරිතෝෂිකයක් ගෙවිය යුතු වුවද , කාර්යාංශය විසින් සේවය අවසන් කළ සේවකයින් 19 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී පාරිතෝෂික මුදල් ගෙවීමේ දී දින 75 සිට 1654ක කාල ප්‍රමාදයක් සිදු වී තිබුණි. | පුහුණු උපදේශිකාවන් හට සේවා පැය පදනම මත ගෙවීම් කරන බැවින් ඔවුනට පාරිතෝෂික දීමනා ලබා ගැනීම සඳහා හිමිකමක් නොමැත යන පදනම මත පිහිටා 2012 වසර වන තුරු කාර්යාංශයේ සේවයෙන් ඉවත් වූ පුහුණු උපදේශක/උපදේශිකාවන් හට පාරිතෝෂික දීමනා ගෙවීම සිදුකර නොතිබුණි.<br><br>කාර්යාංශයේ පුහුණු උපදේශක/උපදේශිකා තනතුරක සේවය කරනු ලැබූ එක් පුහුණු උපදේශිකාවක් කාර්යාංශයේ සේවයෙන් ඉවත් වූ පසු තමන්ට පාරිතෝෂික දීමනා ලබාගැනීමේ හිමිකමක් පවතින බවට පවසමින් නැඟෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයෙහි පැමිණිල්ලක් ගොනුකර තිබූ අතර එම පැමිණිල්ලට අදාල පරීක්ෂණයට අනුව කම්කරු දෙපාර්තුමේන්තුව විසින් ගෙවීම් කරන ලෙස කරනු ලැබූ නියෝගයට අනුව මෙම ගෙවීම් සිදුකර ඇත.<br><br>ඒ අනුව 2012 වසරට කලින් සේවයෙන් ඉවත් වූ උපදේශිකාවන්ද, පාරිතෝෂික දීමනා ගෙවීම් කරන ලෙස ඉල්ලීම් සිදු කිරීම නිසා ඔවුන් වෙත ද පසුව පාරිතෝෂික දීමනා ගෙවීම් සිදුකර ඇත. |
| ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br><br>i. මුදල් රෙගුලාසි 371(2) ඇ ඡේදය | අත්තිකාරම් අදාළ කාර්යය නිම කල විගස පියවිය යුතු වුවත්, අවස්ථා 18 කදී ලබා ගන්නා ලද රු.238,183 ක අත්තිකාරම් මුදල් වසර 09 කට වඩා වැඩි කාලයක් පියවීමට කටයුතු කර නොතිබුණි. | මෙම අත්තිකාරම් ලබා ගත් නිළධාරින් හදිසියේ සේවය හැරගොස් සිටි නිසා එම අත්තිකාරම් නිරවුල් කර ගැනීමට කාර්යාංශයට නොහැකිව තිබුණි.කෙසේ වුවද මෙම අත්තිකාරම් නිරවුල් කර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත. |

| | |
|---|---|
| ii.මුදල් රෙගුලාසි 395 (ඇ)<br>එක් එක් මාසය අවසානයේ ඇති ගනුදෙනු සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයන් පිළියෙල කර ඉදිරිපත් කළ යුතු වුවත්, කාර්යාංශයේ ජංගම ගිණුම් 15 ක් හා විදේශ තානාපති කාර්යාලවල පවත්වා ගෙන යනු ලබන කාර්යාංශයේ කම්කරු සුභසාධන අංශවල බැංකු ජංගම ගිණුම් 17 කට අදාළ සැසඳුම් ප්‍රකාශයන් 32 ක් මාසයක් හා මාස 03 ක් අතර කාල ප්‍රමාදයක් සහිතව පිළියෙල කර ඉදිරිපත් කර තිබුණි. | සියළුම බැංකු සැසඳුම් ඊළඟ මස 15 වන දිනට ප්‍රථම සිදු කරන ලෙස නිළධාරීන් හට වගකීම් පවරමි.<br>විදේශ තානාපති කාර්යාලවල සේවය කරන නිළධාරීන් අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර අදාළ මුල්ලේඛන ද සමඟ විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා තැපෑලෙන් එවීමට පියවර ගනුලබන අතර එසේ ලැබීමට යම් කාලයක් ගතවීම හේතුවෙන් ප්‍රමාදවීම සිදු වී ඇත.කෙසේ වුව ද මෙයට පිළියමක් ලෙස ඉදිරියේදී වෙනත් සුදුසු කිසියම් ක්‍රියාමාර්ගයක් ගැනීමට අදහස් කරනු ලැබේ. |
| iii.මුදල් රෙගුලාසි 756<br>විදේශ තානාපති කාර්යාල වල පවත්වා ගෙන යනු ලබන කාර්යාංශයේ කම්කරු සුභසාධන අංශ 12 ක් , සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර සමීක්ෂණ වාර්තා එවන ලෙස සියළු තානාපති කාර්යාල දැනුවත් කළ අතර ලැබී ඇති භාණ්ඩ සමීක්ෂණ වාර්තා අඩංගු ගොනුව 2014.7.30 වන දින විගණනයට භාර දී ඇත.2014 වර්ෂයේ සියළුම කම්කරු අංශයන්හි භාණ්ඩ සමීක්ෂණයන් සිදු කිරීමට පියවර ගනු ලැබේ. |
| ඇ) 1990 ඔක්තොම්බර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ<br>2.1.1 ඡේදය<br>මාස 06 කට වරක් වාහන වල ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදු කළ යුතු වුවත් , සමාලෝචිත වර්ෂයේ වාහන 117 ක් සඳහා ඉන්ධන රු.27,333,369 ක් වැය කර තිබුනද එවැනි පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | ඉදිරියේදී අදාළ පරීක්ෂාවන් කිරීමට සැළසුම් කර ඇත. |
| ඉ)2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය<br>i. 5.4.12 වගන්තිය<br>වැට් බදු ආවරණය කිරීම සඳහා මුදල් ගෙවීමෙන් පසු ඊළඟ මාසයේ 15 වන දින හෝ එදිනට පෙර එකී ගෙවීම් පිළිබඳ විස්තර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල්වරයා වෙත දැනුම් දිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | එසේ යැවීමට පියවර ගනු ලැබේ. |
| ii. 1.2.1 වගන්ති<br>ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සහතික විය යුතු වූ කරුණු සම්බන්ධයෙන් ප්‍රසම්පාදන අස්ථිත්වය අවධානය යොමු | විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශයේ නිර්දේශ මත කොරියානු රැකියා සඳහා පිටත්වන ශ්‍රමිකයන් සඳහා සහ පිරිමි ශ්‍රමිකයන් සඳහා පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමේ පරමාර්ථ ඇතිව අධ්‍යක්ෂ |

| | |
|---|---|
| නොකර පෞද්ගලික ඉංජිනේරු සේවා සමාගමකට අයත් ඉඩමක් 99 අවුරුදු බදු පදනම මත ලබා ගෙන ඒ සඳහා රු.මිලියන 20 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. | මණ්ඩලයේ අනුමැතිය මත මෙම ඉඩම මිලදී ගැනීමේ කටයුතු වෙනුවෙන් අත්තිකාරම් ගෙවා ඇත. |
| iii.ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොත අංක 19<br>රු.20,000 ට වැඩි අළුත් වැඩියා වියදම් සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අවස්ථා 09 කදී රු.4,927,672 ක අළුත්වැඩියා සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | කාර්යාංශයේ අනුමත මූල්‍ය බලතල සීමාවන්ට යටත්ව මෙය සිදුකර ඇත.ඉදිරි අළුත්වැඩියාවන්හිදී රේඛීය අමාත්‍යාංශයේ ලේකම් වරයාගේ අනුමැතිය ලබාගැනීමට පියවර ගනු ලැබේ. |
| **2.5 <u>ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>**<br><br>ජපන් තනාපති කාර්යාලයේ කම්කරු සුභසාධන අංශයට කම්කරු සුභසාධන නිළධාරි තනතුරක් අනුමත කර නොතිබූ අතර 2012 වර්ෂයේ හා 2013 වර්ෂයේ අනුමත නොවූ තනතුරක් සඳහා පිළිවෙලින් රු.5,103,405 ක් හා රු.3,483,992ක් වැටුප් හා දීමනා ගෙවා තිබුණි.කාර්යාංශය විසින් ලබා දෙන ලද පිළිතුරට අනුව ජපානයේ රැකියා කරන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සම්බන්ධයෙන් ගැටළු නොමැති බවත් ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා රැකියා අවස්ථා ප්‍රවර්ධනය එම නිළධාරියාගේ කාර්යභාරය වන බවත් සුභසාධන කටයුතු අවම මට්ටමක පවතින බැවින් එම නිළධාරියාගේ වැටුප් හා දීමනා ගෙවීම් පමණක් සිදු කරන බව දක්වා තිබුණි. | ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා රැකියා ප්‍රවර්ධනය වෙනුවෙන් ජපානයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට සුභසාධන නිළධාරියෙකුගේ අවශ්‍යතාව 2009 දී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පෙන්වා දී ඇත.ඒ සඳහා කම්කරු සුභසාධන නිළධාරියෙකු ලෙස චන්න අබේනායක මහතා පත් කිරීමට 07/07/2009 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පත්‍රිකා අංක 36/2009 යටතේ අනුමැතිය ලබා ගෙන ඇත.එම අනුමැතිය පදනම්ව අදාළ නිළධාරියා ජපානයේ තානාපති කාර්යාලය වෙත රැකියා ප්‍රවර්ධන සහ සුභසාධන වෙනුවෙන් පත්කර යවා ඇත.<br>ජපානය තුල ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් වෙනුවෙන් විශාල සුභසාධන කාර්යභාරයක් නැතත් රැකියා අවස්ථා ලබා ගැනීම සඳහා වන රාජකාරීන් වල බහුලව නියුතු විය යුතුය.අදාල නිළධාරියා විසින් එම ප්‍රවර්ධන කාර්යයන්හි යෙදී ඇත.එම නිළධාරියාට ඒ වෙනුවෙන් වැටුප් හා දීමනා ගෙවා ඇත.<br>**වර්තමාන තත්වය -** අදාළ නිළධාරියාට පැවරූ කාර්ය භාරය අනුව ඔහු විසින් රැකියා ප්‍රවර්ධන රාජකාරී කිරීම හේතුවෙන් ශ්‍රී ලංකාවට ලැබුණු රැකියා ප්‍රමාණය පිළිබඳව කාර්යාංශය සෑහීමකට පත් නොවන බැවින් ඉදිරි මාස හයකට පමණ ඔවුන්ගේ සේවය ලබාගෙන ආපසු කැඳවීමට තීරණය කර ඇත.ඒ බව ඔහු වෙත දැනුම් දී ඇත. |
| **3.<u>මූල්‍ය සමාලෝචනය</u>**<br><br>**3.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>**<br><br>සමාලෝචිත වර්ෂයේ කාර්යාංශයේ සහ එහි පරිපාලිත සමාගමේ ක්‍රියාකාරකම් වලින් ආදායම් බදුවලට පෙර අතිරික්තය රු.326,198,141ක් වූ අතර ,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.258,895,523ක අතිරික්තයක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.67,302,618 ක් හෙවත් සියයට 26 වර්ධනයක් පෙන්නුම් කෙරිණි.ඉකුත් වර්ෂය හා සැසඳීමේදී ආදායමේ වැඩිවීම වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. | |

| | |
|---|---|
| **3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි** | |
| කාර්යාංශයට එරෙහිව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට බාහිර පාර්ශවයන් විසින් නඩු 15 ක් ගොනු කර තිබුණු අතර කාර්යාංශය විසින් බාහිර පාර්ශවයන් වෙත එක් නඩුවක් පවරා තිබුණි. | කාර්යාංශය විසින් කාර්යාංශ පණතේ විධිවිධාන ක්‍රියාවට නැංවීමේදී ගනු ලැබූ තීරණයන්ට එකඟ නොවුණු පාර්ශවයන් හා විවිධ වැරදිවලට එරෙහිව විනයානුකූලව ගනු ලැබූ ක්‍රියාමාර්ගයන්ට එකඟ නොවූ කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ව සිටි අය විසින් මෙම නඩු පවරා ඇති අතර කාර්යාංශයේ නීති අංශය මෙම නඩු වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| **4. මෙහෙයුම් සමාලෝචනය**<br>**4.1 කාර්යසාධනය** | |
| පහත සඳහන් කරුණු ද නිරීක්ෂණය විය. | |
| (අ) කාර්යාංශයට අයත් ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන 18 ට අමතරව පෞද්ගලික පුහුණු මධ්‍යස්ථාන 11 ක් මගින් විගමනික ශ්‍රමිකයින් පුහුණු කිරීම සිදු කරනු ලබන අතර පෞද්ගලික පුහුණු මධ්‍යස්ථාන වල පුහුණු කිරීම් හා පුහුණුලාභීන් වෙත සලසනු ලබන සේවාවන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් අධීක්ෂණයක් හා පරිපාලනයක් කාර්යාංශය විසින් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරීම සඳහා අවසර ලබා දී ඇති අතර කාර්යාංශයේ පුහුණු අංශයේ අනුමැතියකින් තොරව පුහුණු පාඨමාලා ආරම්භ කිරීමට අවසර ලබා දී නොමැත.එමෙන්ම අදාළ පෞද්ගලික පුහුණු මධ්‍යස්ථාන සඳහා උපදේශිකාවන් ලබා දෙනුයේ කාර්යාංශයේ පුහුණු අංශය මඟිනි.කාර්යාංශයේ පුහුණු අංශය භාර කළමනාකරු/සහකාර කළමණාකරිනී සහ විෂයභාර අනෙක් නිළධාරීන් මෙම මධ්‍යස්ථාන අධීක්ෂණය කිරීම සිදුකරන අතර එම අධීක්ෂණ වාර්තා ඉහළ කළමනාකාරීත්වයට ඉදිරිපත් කරණු ලැබේ. |
| ආ)සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්ක ගත කාර්යසාධන මට්ටම සම්පූර්ණයෙන්ම ඉටුකර නොතිබුණු විෂයන් 13 හා කාර්යසාධනය දුර්වල මට්ටමක පැවති විෂයන් 25ක් විය. | මෙම කරුණු පිළිබඳව සමාලෝචනය කර කාර්ය සාධනය ප්‍රශස්ථ මට්ටමකට ගෙන ඒම සඳහා පියවර ගැනීමට කටයුතු කරමි. |
| 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා | |
| පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | |
| අ) විධිමත් විනය පරීක්ෂණයකින් පසු සේවයෙන් පහ කරනු ලැබූ කාර්යාංශ නිළධාරියෙකු විනය පරීක්ෂණ නියෝග නොසලකා හැර නැවත සේවයේ පිහිටුවා තිබුණ ද , 2014 පෙබරවාරි 12 දින නැවත වරක් සේවයේ පිහිටුවීම අවලංගු කර තිබූ අතර 2013 ජුලි සිට 2014 ජනවාරි මාසය දක්වා වැටුප් දීමනා වශයෙන් රු.152,960 ක මුදලක් ගෙවා තිබුණි. | කාර්යාංශය විසින් විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අංක MFE\ADM\3\5\8 හා 2014-01-29 දිනැති ලිපිය මඟින් ලබා දී තිබූ උපදෙස් පරිදි (ලිපියෙහි 7 ඡේදයෙහි (a) අනුව ඒ.පී.නිරිඇල්ල මයා යළි සේවයේ පිහිටුවීමේ නියෝගය 2014-02-12 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කර ඇත. |
| ආ)කාර්යාංශය විසින් ප්‍රසාද දීමනා ගෙවීමේදී,වර්ෂය තුළ වැටුප් රහිත නිවාඩු 10 ක් හෝ ඊට වැඩියෙන් ලබා ගන්නා ලද නිළධාරීන්ට ප්‍රසාද දීමනා සඳහා හිමිකම් නොමැති වුවත් ඊට පටහැනිව කාර්යාංශයේ පද්ධති විශ්ලේෂක වශයෙන් සේවයේ නියුක්තව සිට 2007 දෙසැම්බර් 24 දින සිට වැටුප් රහිත නිවාඩු ලබා ඇති නිළධාරියෙකු වෙත 2007 වර්ෂයේ වැටුප් රහිත නිවාඩු 11 ½ ලබාගෙන තිබියදී රු.51,875 ක් | මෙම නිළධාරියා දැනට කුවේට් රැකියාවක නිරත වන බව දැනගැනීමට ලැබී ඇති අතර මෙම මුදල් කාර්යාංශයට ආපසු ගෙවන ලෙස ඔහු වෙත දැනුම් දී ඇත.එසේ ක්‍රියා නොකළහොත් ඔහු වෙත ගෙවිය යුතු පාරිතෝෂික මුදලින් |

| | |
|---|---|
| ප්‍රසාද දීමනා ලෙස ගෙවා තිබුණි. නිළධාරියාගෙන් එම මුදල් කාර්යාංශය වෙත අය කර ගැනීමට විගණන දින වන 2014 මැයි 12 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | අයකරගෙන ඉතිරි මුදල අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගනු ඇත. |
| ඇ)ඉහත පද්ධතිය විශ්ලේෂක විසින් අවස්ථා කිහිපයකදී ලබා ගන්නා ලද වැටුප් රහිත නිවාඩුකාල සීමාවට අදාළ කාර්යාංශය හා නිලධාරියා එළැඹි ගිවිසුම් ප්‍රකාරව සේවය කල යුතු වූ අවම සේවා කාලය සේවා නොකිරීම හේතුවෙන් අයවිය යුතු රු.866,828 ක දණ්ඩන මුදල අයකර ගැනීමට කාර්යාංශය විසින් 2014 මැයි 12 දින දක්වාම කටයුතු කර නොතිබුණි. | මෙම මුදල අයකර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනෙමින් පවතී. |
| ඇ)සමාලෝචිත වර්ෂය අවසන් වන විට විගමණිකයින්ගේ පැමිණිලි / ආරවුල් සමථයකට පත්කර ගැනීම සඳහා නියෝජිත ආයතන විසින්,සමාලෝචිත වර්ෂයේ සහ වර්ෂ 05 ක කාලපරිච්ඡේදයයක් තුළ තැන්පත් කැර තබූ මුදල්වල ,එකතුව රු.17,465,688 ක් වූ අතර, තැන්පතු මුදලින් නිරවුල් නොකළ ශේෂයන් නිරවුල් කිරීමට 2014 සැප්තැම්බර් වන විටත් කටයුතු කර නොතිබුණි. | මෙම මුදල් අදාළ පැමිණිලි කරුවන් වෙත ගෙවා නිම කිරීමට පියවර ගැනෙමින් පවතී.මෙම මුදල් අතුරින් රුපියල් 6,160,507.00 මුදලක් මේ වන විට ගෙවීම් කර ඇත. |
| ඉ)විගමණික ශ්‍රමිකයන් සඳහා අර්ථ සාධක අරමුදල් ක්‍රමයක් කාර්යාංශය විසින් 1989 සිට 1996 වර්ෂය දක්වා පවත්වාගෙන ගොස් තිබූ අතර දායක මුදල් ලෙස විගමණිකයන් ගෙවනු ලබන මුදලින් සියයට 60 ක් අදාළ ශ්‍රමිකයා වෙනුවෙන් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ තැන්පත් කර ඉතිරය කාර්යාංශය විසින් රඳවා ගෙන තිබු මුදල රු.6,110,128 ක් විය. අදාළ අර්ථ සාධක අරමුදල් ක්‍රමය වර්තමානයේ අක්‍රිය තත්වයේ පැවති අතර කාර්යාංශය විසින් විගමනිකයින් 1620 කට අයත් එම මුදල් ඔවුන්වෙත මුදාහැරීමකින් තොරව රඳවා ගෙන තිබුණි. | මෙම මුදල් වෙනම තැන්පත් ගිණුමක් ලෙස පවත්වාගෙන යනු ලබන අතර අදාළ ශ්‍රමිකයන් ඉල්ලුම් කරන ආකාරය අනුව නිදහස් කරනු ලැබේ.එමෙන්ම මෙම ශේෂයන් සඳහා කාර්යාංශය විසින් පොළී මුදලක් ද බැර කරනු ලැබේ.මෙම තැන්පත් කරුවන් වෙත ලිඛිතව දැනුම් දී එම මුදල් ආපසු ගෙවීමේ ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීමට අදහස් කරමි. |
| ඊ)1990 වර්ෂයේ ඉරාකය විසින් කුවේට් ආක්‍රමණය කිරීමෙන් එහි රැකියාවන්හි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ට සිදු වූ ආපදාවන්ට වන්දි ගෙවීම සඳහා එක්සත් ජාතීන්ගේ වන්දි කොමිසමෙන් ලැබුණු මුදලින් ඉතිරි වූ රු.2,822,502,845 ක මුදල අදාළ ශ්‍රමිකයන් වෙත ගෙවා අවසන් කිරීමට විධිමත් වැඩපිළිවෙලක් කාර්යාංශය විසින් ගෙන නොතිබුණි. | මෙම සංඛ්‍යාවෙන් රුපියල් 3,946,009,100 ක මුදලක් වන්දි මුදල් අදාළ හිමිකරුවන් නිවැරදිව හඳුනාගෙන ගෙවීම් කරන තෙක් තාවකාලකව බැංකු තැන්පත්වල තැබීමෙන් උපයාගත් පොළී මුදල් හා විදේශ විනිමය හුවමාරු වාසිය වේ. ඉදිරිපත් නොවූ වන්දි හිමිකරුවන්ට අදාළ ලේඛන හා අනන්‍යතාවය ඉදිරිපත් කර වන්දි මුදල් ලබා ගන්නා ලෙස අප විසින් ලිපි මඟින් හා පුවත්පත් දැන්වීම් මඟින් දැනුම් දී ඇත.මේ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට පියවර ගනු ඇත. |
| උ) 2009 සිට 2013 දක්වා රක්ෂණ වන්දි ලෙස රක්ෂණ ආයතනයෙන් ලද මුදලින් රු.3,474,174 ක මුදලක් අදාළ විගමණික ශ්‍රමිකයන්ට ගෙවීමට කටයුතු නොකර ණයහිමියන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණි. | මේ මුදල් ලබාගැනීම සඳහා ඉදිරිපත් වන ලෙස ලිපි මඟින් හා පුවත්පත් දැන්වීම් මඟින් අදාළ වන්දි ඉල්ලුම් කරුවන් දැනුවත් කර ඇති අතර මරණ වන්දි ගෙවීමේදී පැන නැඟි ඇති නෛතික කරුණු ආදිය නිසා මෙම ප්‍රමාදයන් ඇති වී තිබේ.මේ සම්බන්ධයෙන් සුදුසු විසඳුමක් හැකි ඉක්මනින් ලබා දීමට අදහස් කරමි. |
| **4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**<br>------------------------------<br>පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | |
| අ) කාර්යාංශය විසින් තැන්පත් කර තිබූ රු.1,210,968 ක් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණද එම මුදල ආපසු අයකර ගැනීම සම්බන්ධව කිසිදු පසු විපරමක් කර නොතිබුණි. | කාර්යාංශය විසින් ලබාගන්නා විවිධ සේවාවන් වෙනුවෙන් මෙම මුදල් ඇප තැන්පත් ලෙස තබා ඇති අතර මෙම මුදල් පිළිබඳව යළි සමාලෝචනය කර අයකර ගත හැකි ඇප මුදල් අයකර ගැනීමට පියවර ගනු ලැබේ. |

| | |
|---|---|
| ආ)ශ්‍රී ලංකා විදේශ සේවා රැකියා ඒජන්සියේ මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව විගමනික ශ්‍රමිකයින් 32 දෙනෙකු වෙත ගෙවිය යුතු වූ රු.9,813,000 ක මරණ වන්දි වලින් 11 දෙනෙකු සඳහා ගෙවිය යුතු වූ රු.3,465,000 ක මුදල සඳහා රක්ෂණ වන්දි මුදල් ලැබී ඇතත් ,කාර්යාංශය විසින් විගණිත දින වූ 2014 සැප්තැම්බර් 12 දින වනවිටත් වසරක කාලයක් ඉක්මවා ඇතත් එම මුදල් අදාළ වන්දි හිමියන්ට නිදහස් කිරීමට විධිමත් පියවර ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ විදේශ රැකියා ඒජන්සි ආයතන සමඟ ක්‍රියාත්මක වන අදාළ අවබෝධතා ගිවිසුමේ වන්දි හිමිකම් මුදල් කාර්යාංශය වෙත ලබා ගැනීම සම්බන්ධව කොන්දේසි ඇතුළත් නොවන අතර,අදාළ රක්ෂණ වන්දි මුදල්,හිමිකරුවන් වෙත නිරවුල් කිරීම දෙපාර්ශවය විසින් ඇතිකරගෙන ඇති අවබෝධතා ගිවිසුම අනුව සිදු කරනු ලැබේ.<br><br>2014.07.05 වන දින කළමණාකාරීත්වය සමඟ පැවති සාකච්ඡාවකින් අනතුරුව අදාළ චෙක්පත් ඉතා කඩිනමින් ඉල්ලුම්කරුවන් වෙත යොමු කිරීම පිළිබඳව අවධානය යොමු වූ අතර, ඒ අනුව විදේශ රැකියා ඒජන්සි ආයතනය විසින් 2014.07.05 වන දින සිට වන්දි ලාභීන්ගේ මුදල් කඩිනමින් ලබාදීමට එකඟ වී ඇත. |
| ඇ)වාහන ණය ලේඛණය යාවත්කාලීන කර නොතිබූ අතර නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | වාහන ණය ලේඛණය මේ වන විට යාවත්කාලීන කර ඇත. |
| i.නිළධාරීන් තිදෙනෙකු වෙත ගෙවන ලද වාහන ණය රු.1,049,000ක් වාහන ණය ලේඛණයේ ඇතුළත් කර නොතිබුණි. | මේ වන විට මෙය නිවැරදි කර ඇත. |
| ii. අලුතින් ලබාදෙන ණය ඇතුළත් නොකිරීම හා අයකරන ලද ණය මුදල් නිසි පරිදි ලේඛණ ගත නොකිරීම නිසා නිළධාරියෙකුගේ රු.372,000 ක ණය ශේෂය රු.87,360 ක් ලෙස ණය ලේඛනයේ දක්වා තිබුණි. | මේ වන විට මෙය නිවැරදි කර ඇත. |
| ඈ)නිළධාරීන් 38 දෙනෙකු විසින් ලබා ගෙන තිබූ රු.5,625,164 ක් වූ උත්සව,ක්ෂණික,ආපදා සහ වාහන ණය මුදල් හා රු.512,009 ක පොළී මුදල ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ඇපකරුවන් සිටින ණය මුදල් ඔවුන්ගෙන් අය කර ගැනීමට සහ ඇපකරුවන් නොමැති ණය මුදල් අදාළ ණය කරුවන්ගෙන් අය කරගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට අපගේ නීති අංශය වෙත යොමුකර ඇත. |
| ඉ)නිළධාරියෙකු විසින් ලබා ගත් අත්තිකාරම් නොපියවා තිබියදී අවස්ථා 09 ක දී නැවත අත්තිකාරම් මුදල් ලෙස රු.3,184,340 ක මුදලක් එම නිළධාරියාටම ලබා දී තිබූ බව නිරීක්ෂණය විය. | මෙම අත්තිකාරම් වලට අදාළව ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරනු ලැබුයේ මෙම නිළධාරියා බැවින් ඔහුවෙත අදාළ අත්තිකාරම් නිකුත් කර ඇත.කාර්යබහුලත්වය මත මෙම අත්තිකාරම් නිරවුල් කිරීමේ ප්‍රමාදයක් වූ බව ඔහු විසින් ප්‍රකාශ කළ අතර ඉදිරියේදී මෙවැනි තත්වයන් ඇති නොවන ආකාරයට කටයුතු කරනු ලැබේ. |
| **4.4. ඌන උපයෝජන වත්කම්**<br>---------------------------<br>පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | |
| අ) තංගල්ල පුහුණු මධ්‍යස්ථානයේ තට්ටු ඇඳන් 100 ක් සඳහා මදුරු දැල් 200ක් ඇණවුම් කර ලබාගෙන තිබුණි.එක් මදුරු දැලක් එක් තට්ටු ඇඳක් සඳහා ප්‍රමාණවත් වූ බැවින් අවශ්‍යතාවය ඉක්මවා මදුරු දැල් 100 ක් ඇණවුම් කිරීම හේතුවෙන් රු.245,000 ක් වටිනා මදුරු දැල් ප්‍රයෝජනයකට නොගෙන ගබඩා කර තිබුණි. | (අ) තංගල්ල විගමණික සම්පත් මධ්‍යස්ථානයෙහි අවශ්‍යතාව අනුව ,කළමණාකරු (පුහුණු - ගෘහස්ථ) විසින් ඉල්ලුම් කර ඇති පරිදි මදුරු දැල් 200 ක් ඇණවුම් කර ඇත.එම මදුරු දැල් වලින් 100 ක ප්‍රමාණයක් අවශ්‍යතාවය පරිදි වෙනත් විගමණික සම්පත් මධ්‍යස්ථාන වෙත ලබා දීමට අවශ්‍ය කටයුතු පුහුණු අංශය මඟින් දැනට සිදු කෙරෙමින් පවතී. |

| | |
|---|---|
| ආ)කාර්යාංශය විසින් සියළුම දිස්ත්‍රික්ක අනාවරණය වන පරිදි විගමණික පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි.ඒ අනුව කතරගම ,රත්නපුර, හාලිඇළ, හෝමාගම සහ දඹුල්ල විගමනික සම්පත් මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා 2007 වර්ෂයේ සිට 2013 ජුලි මස දක්වා කාල සීමාව තුළදී රු.57,272,816 ක මුදලක් වැය කර තිබුණ නමුත් සමාලෝචිත වර්ෂය අවසානය තෙක් එම ඉදිකිරීම් ව්‍යාපෘති වල වැඩ අවසන් කර නොතිබූ බැවින් මධ්‍යස්ථාන වල ප්‍රයෝජනයට ගත නොහැකි විය | (ආ) කාර්යාංශය විසින් ඉදිකරන විගමණික සම්පත් මධ්‍යස්ථානවල වර්තමාන තත්ත්වය 2014.11.30 දිනට ප්‍රගතිය පහත පරිදි වේ.<br><br>කතරගම විගමණික සම්පත් මධ්‍යස්ථානය<br><br>මෙම විගමණික සම්පත් මධ්‍යස්ථානය ඉදි කිරීම සඳහා අවශ්‍ය සැලැස්ම සකස් කර ඇති අතර මෙම ඉඩමෙහි පස් පරීක්ෂාව සිදු කර ඇත.ටෙන්ඩර්පත් සකස් කර ඇති අතර ටෙන්ඩර්පත් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත යවා ඇත.උපදේශක ආයතනය සමඟ ගිවිසුම අත්සන් කිරීම සඳහා ගිවිසුම සකස් කර 2014/07/18 දින කාර්යාංශය වෙත ලබා දී ඇති අතර 2014/07/31 දින ගිවිසුම අත්සන් කරන ලදී.<br><br>රත්නපුර විගමණික සම්පත් මධ්‍යස්ථානය<br><br>Link Engineering (pvt) Ltd ආයතනය වෙත 2014/07/16 දින කොන්ත්‍රාත්තුව පිරිනමන ලදී.මෙම මධ්‍යස්ථාන ඉදිකිරීම් සඳහා 2014/08/21 දින මුල්ගල තබන ලදී.මෙම මධ්‍යස්ථානය ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතී.<br><br>හාලිඇළ විගමණික සම්පත් මධ්‍යස්ථානය<br><br>මෙම මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර කොන්ත්‍රාත්තුව 2014/10/29 දින RN Constructions (pvt) Ltd ආයතනය වෙත පිරිනමන ලදී.මෙම ඉදිකිරීම් කටයුතු මේ වන විට සිදුවෙමින් පවතී.<br><br>හෝමාගම ඉඩම<br>මෙම ඉඩමෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය පස් පරීක්ෂාව සිදු කර ඇති අතර සැළසුම සකස් කිරීමට ගොඩනැගිලි දෙපාර්තුමේන්තුව වෙත පවරා ඇත. මෙම ඉඩමෙහි<br>නැවත මායිම් ලකුණු කිරීම 2014.11.24 දින සිදු කරන ලදී.මායිම් පෙන්වා දී ඇති ආරක්ෂිත වැට ඉදිකිරීමට කටයුතු සිදු කිරමින් පවතී.<br><br>දඹුල්ලේ විගමණික සම්පත් මධ්‍යස්ථානය<br>දඹුල්ලේ විගමණික සම්පත් මධ්‍යස්ථානය ඉදිකිරීමට කොන්ත්‍රාත් ආයතනයක් තෝරා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කරනු ලැබූ අතර තෝරාගත් කොන්ත්‍රාත් කරුගේ මිල ගණන් හා ඊළඟ මිළ ගණන් ඉදිරිපත් කළ කොන්ත්‍රාත් කරුගේ මිළ ගණන් අතර වැඩි පරතරයක් තිබූ බැවින් යළි මිළ ගණන් කැඳවීමට අමාත්‍ය මණ්ඩලය උපදෙස් දෙන ලදී.<br><br>මෙම ඉදිකිරීම් හැකි ඉක්මනින් සිදුකර අවසන් කිරීමට පියවර ගනු ලැබේ. |

| | |
|---|---|
| **4.5 හඳුනාගන්නා ලද පාඩු**<br>------------------------<br>අ)2011 හා 2012 වර්ෂවලට අදාළව ජාතික රක්ෂණ මුදල් භාරයට හා ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති නියෝජිත ආයතනය වෙත රක්ෂණ වාරික ලෙස ගෙවා තිබූ රු. 218, 681, 760 ක මුදලෙහි ඇතුලත රු.23,430,210 ක් යෙදවුම් බදු ගෙවීම් ගණනය කිරීමේදී හිලව් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙවැනි සිදුවීම් ඉදිරියේදී ඇති නොවන ආකාරයට අභ්‍යන්තර පාලනය ශක්තිමත් කර ඇත. |
| ආ) 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ගුවන් තොටුපල ඒකකය මඟින් විගමණිකයින් 146 ක් කාර්යාංශයේ ලියාපදිංචි කිරීමේදී රු. 822,894 ක මුදලක් විගමණිකයන්ගෙන් අයකරගෙන නොතිබුණි. | මෙම හිඟ මුදල් අයකර ගැනීම සඳහා අදාළ විගමණික ශ්‍රමිකයින් වෙත ලියාපදිංචි තැපෑලෙන් ලිපි යවා ඇති අතර විගණන විමසුමෙහි දක්වා ඇති අතර කාළසීමාව තුළ රාජකාරියේ නිරතව සිටි වගකිව යුතු නිළධාරීන්ගෙන් නිදහසට කරුණු විමසා අදාළ මුදල් අයකර ගැනීමට පියවර ගනු ලැබේ.මේ තත්වය යළි ඇති නොවන ආකාරයට පියවරද ගෙන ඇත. |
| ඇ)බැංකු ගිණුමකට ලියාපදිංචි ගාස්තු ලෙස 2007 වර්ෂයේ තැන්පත් කරන ලද රු.12,260 ක් වූ උපලබ්ධි නොවූ තැන්පතු අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි විධිමත් පරීක්ෂණයකින් තොරව කපා හැර තිබුණි. | මෙය ගිණුම්කරණයේදී ඇතිවූ දෝෂයක් වන අතර එය නිවැරදි කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි පියවර ගෙන ඇත. |
| ඈ)ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය විසින් 2009 ජනවාරි, අප්‍රේල්, 2010 සැප්තැම්බර් සහ 2013 ජනවාරි මාසයන්හි සේවානියුක්ති භාර අරමුදලේ දායක මුදල් යාවත්කාලීනව නොගෙවීම හේතුවෙකන් රු. 5,986 ක අධිභාර මුදලක් ගෙවා තිබුණි. | මෙවැනි තත්වයන් ඉදිරියේ ඇති නොවන ලෙසට කටයුතු කරන ලෙසට ඒජන්සිය වෙත උපදෙස් දෙන ලදී. |
| **4.6 <u>වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් කාර්යාංශයේ සම්පත්</u>**<br>පහත සඳහන් කරුණු නිරීක්ෂනය විය. | |
| අ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව කාර්යාංශයට අයත් හා කුළී පදනම මත ලබා ගන්නා වාහන 03 ක් අදාළ අමාත්‍යාංශය හා වෙනත් රජයේ ආයතන විසින් පාවිච්චි කරමින් තිබුණි.ඒ සඳහා කාර්යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී රු.2,229,874 ක් ඉන්ධන හා කුළී ගෙවා තිබුණි. | කාර්යාංශයේ විෂය පථයට අයත් රටවිරු සංවිධාන කටයුතු පිහිටුවීම සහ බලගැන්වීම සහ දිරි ගැන්විම කටයුතු පළාත් මට්ටමින් සිදු කරනු ලැබූ අතර ඒවායේ ක්ෂේත්‍ර වැඩසටහන් වලදී අමාත්‍යාංශයේ නිළධාරීන් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආශ්‍රිතව රාජකාරී කටයුතු සඳහා ස්ථාපිත කර ඇති සංවර්ධන නිළධාරීන්ගේ අධීක්ෂණය සහ ක්‍රියාකාරීත්වය ඇතිව සිදු කරනු ලැබූ අතර එම කටයුතු වලට සම්බන්ධ වූ ප්‍රවාහන පහසුකම් කුළී පදනම යටතේ ලබාගත් වාහන මඟින් ලබා දී ඇත. |
| ආ)කාර්යාංශයේ නිළධාරින් 10 දෙනෙකු අමාත්‍යාංශයේ හා රජයේ අනෙකුත් ආයතන වල සේවයේ යොදවා තිබුනු අතර 2013 හා 2014 ජුනි දක්වා පිළිවෙලින් රු.5,425,814 ක් හා රු.2,527,220 ක මුදලක් වැටුප් හා වේතන ලෙස ගෙවා තිබුණි. | රැකියා සඳහා විදේශගත වන ශ්‍රමිකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ සමාජ හා ආර්ථික තත්වයන් නංවාලීම සඳහා කාර්යාංශය විසින් සුභසාධන හා ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාවට නංවනු ලබයි. මෙසේ විගමණික ප්‍රජාව ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සම්බන්ධ ප්‍රතිපත්තිමය තීරණයන් රේඛීය අමාත්‍යාංශය ලෙස විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශය මඟින් ගනු ලැබිණි.ඒ අනුව රටවිරු පියස නිවාස වැඩසටහන,රටවිරු සංවිධාන බලාත්මක කිරීමේ වැඩසටහන,පුහුණු පාඨමාලා නිර්මාණය කිරීම හා පවතින පුහුණු පාඨමාලාවන්හි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ දී කාර්යාංශයට රේඛීය අමාත්‍යාංශය අනෙකුත් ප්‍රජා මූලික කටයුතු සිදුවන අමාත්‍යාංශ හා සම්බන්ධ වෙමින් කටයුතු |

| | |
|---|---|
| **4.7 අනාර්ථික ගනුදෙනු**<br><br>බදුල්ල දිස්ත්‍රික්කයේ හාලි ඇළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අක්කරයක භූමි ප්‍රමාණයක් රු.මිලියන 20 කට මිලදී ගැනීමෙන් පසු ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 594ක වියදමෙන් තට්ටු 06ක විගමනික සම්පත් මධ්‍යස්ථානයක් ඉදිකිරීමට සැළසුම් සකස් කර ඇති අවස්ථාවක බදුල්ල දිස්ත්‍රික්කයේ හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නැවත පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 99 අවුරුදු බදු පදනම මත රු.මිලියන 84 ක මුදලකට ඉඩමක් මිලදී ගැනීමට කටයුතු කිරීම අනාර්ථික ගනුදෙනුවක් බවට නිරීක්ෂණය විය. | කිරීමට සිදුවී තිබූ බැවින් විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාතයාංශයට අනුයුක්තව සේවය කරනු ලබන නිළධාරීන් ද අනෙකුත් රාජ්‍ය ආයතනවල සේවයේ යෙදී සිටින කාර්යාංශ නිළධාරීන් ඉටු කරනු ලබන්නේ විගමනික ප්‍රජාව ඉලක්ක කර ගත් වැඩසටහන් සඳහා බැවින් එම නිළධාරීන් අදාළ ආයතන වෙත මුදාහැර තිබුණි.<br><br>බදුල්ල දිසිත්‍රික්කයේ හාළිඇළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අක්කරයක භූමි ප්‍රමාණයෙහි තට්ටු 6 කින් යුතුව ඉදි කෙරෙන විගමණික සම්පත් මධ්‍යස්ථානය,කාර්යාල හා අනෙකුත් සේවා පහසුකම් සහ මැදපෙරදිග ගෘහසේවිකා පුහුණු පාඨමාලාවන් පැවැත්වෙන මධ්‍යස්ථානයකි.එම මධ්‍යස්ථානයෙහි කාන්තා නේවාසිකාගාරය සහ කාන්තා ගෘහ පුහුණු සේවා පැවැත්වෙන බැවින්,පිරිමි දින 5 පුහුණු පැවැත්වීම හා පිරිමි නේවාසිකාගාර පැවැත්වීම නොයෙකුත් ගැටළු ඇතිවීමට හේතුවිය හැක.<br><br>එබැවින් පිරිමි දින 5 පුහුණු සේවා හා කොරියානු පුහුණු සේවා පහසුකම් ද පිරිමි නේවාසිකාගාර පැවැත්වීම සඳහා ද ,සංචාරක නිවාඩු නිකේතන පහසුකම් වෙනුවෙන් අක්කර 06 රූඩ් 03 පර්චස් 20.6 ක කහගොල්ල ඉඩම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය අත්පත් කර ගැනීමට කටයුතු කර ඇත |
| **4.8 කාර්ය මණ්ඩල පරිපාලනය**<br><br>2013 දෙසැම්බර් 31 දිනට කාර්යාංශයට අදාළව කාර්ය මන්ඩල විස්තර පහත සඳහන් පරිදි වේ.<br><br>අ) 2013 දෙසැම්බර් 31 දිනට කාර්යාංශයේ තනතුරු 24 ක් සඳහා 892 ක ස්ථිර කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබුණද තථ්‍ය ස්ථිර කාර්ය මණ්ඩලය 821 ක් වීමෙන් 71 ක පුරප්පාඩු නිරීක්ෂණය විය.<br><br>ආ) කළමනාකරන සේවා දෙපාර්තුමේන්තුවේ අංක DMS/E4/46/4/274/1 හා 2010 සැප්තැම්බර් 06 දිනැති කාර්ය මණ්ඩල අනුමත කිරීමේ ලිපිය මගින් කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනාවට කාර්යාංශයේ තනතුරු 24 ක් සඳහා 892 ක කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබුණි. එහෙත් ඉහත දැක්වෙන පරිදි අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට කටයුතු සිදු නොකර අනුමත හා පුරප්පාඩු ප්‍රමාණයද ඉක්මවා කොන්ත්‍රාත් ද්වීතියක හා කාර්යාංශයේ පදනම මත පිළිවෙලින් 248,16,හා 03 දෙනෙකු සේවයේ යොදාගෙන තිබුණි. | කාර්යාංශ කටයුතු පුළුල් වීමත් සමඟම විගමණික ප්‍රජාව වෙනුවෙන් කාර්යාංශය විසින් හඳුන්වා දී ඇති නව වැඩසටහන් බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා සේවයෙහි නියුක්තව සිටි කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවූ බැවින් එම කටයුතු බාධාවකින් තොරව අඛන්ඩව පවත්වාගෙන යාම සඳහා කොන්ත්‍රාත් පදනම මත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට සිදුව ඇත.<br><br>2013-12-14 දිනැතිව පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදුන් අනුමැතිය මත මහාභාණ්ඩාගාරයේ කළමණාකරන සේවා දෙපාර්තුමේන්තුවෙහි අනුමැතිය ලබා ගන්නා තෙක් කාර්යාංශයේ කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා කොන්ත්‍රාත් පදනම මත ලිපිකරු හා සමාන්තර ශ්‍රේණියේ නිළධාරීන් පහත කාර්යයන් සඳහා සේවයට බඳවාගෙන ඇත.<br><br>• විගමණික ප්‍රජාව හා සම්බන්ධ ප්‍රධානතම ජාලගත වැඩසටහන වන රටවිරු සංවිධාන සමඟ කටයුතු කිරීම<br><br>• කාර්යාංශ කටයුතු විමධ්‍යගත කිරීම |

- කාර්යාංශය මඟින් විදේශගත වන්නන් සඳහා ලබා දෙන පුහුණුව ජාතික වෘත්තීය පුහුණු සහතික තුන්වන මට්ටම දක්වා උසස් කිරීම.
- ශ්‍රමිකයන් පුහුණු කිරීම සම්බන්ධ කටයුතු සඳහා
- මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපල ඒකකය පිහිටුවීම
- කාර්යාංශයෙහි අයි.එස්.ඕ.9001-2008 තත්ව සහතිකය ලබා ගැනීම
- සමථකරණ කටයුතු විමධ්‍යගත කිරීම
- සේවා ගිවිසුම් අත්සන් කිරීමේ කටයුතු විමධ්‍යගත කිරීම.
- එතෙර තානාපති කාර්යාල වල පිහිටි කම්කරු සුබසාදන අංශයන්හි රාජකාරී කටයුතු
- සංවර්ධන නිළධාරීන් හා සම්බන්ධීකරණ කටයුතු
- කාර්යාංශ වැඩ කටයුතු පුළුල්වීම සමඟ රියදුරන් වැඩිකිරීමට සිදුවීම
- කාර්යාංශයෙහි විශේෂ පැවරුම් වලට අදාළ කටයුතු සිදු කිරීම
- අරාබි භාෂා පරිවර්තන කටයුතු සඳහා භාෂා පරිවර්තකයින් බඳවා ගැනීමට සිදුවීම.
- උපදේශක/උපදේශිකාවන් පුහුණු කිරීම සඳහා ගෘහ පාලන පුහුණු උපදේශිකාවන් බඳවා ගැනීම
- සහනදායී මිල ගණන් යටතේ ගුවන් ටිකට් පත් මිළදී ගැනීම සඳහා ගුවන් ටිකට් පත් ඒකකයක් පිහිටුවීම.
- සභාපති අංශයේ මහජන සම්බන්ධතා කටයුතු සඳහා මහජන සම්බන්දතා නිළධාරියෙකු සහ රහස්‍ය ලේකම් තනතුර සඳහා නිළධාරියෙකු බඳවා ගැනීම
- **e- Employment Migration Management System** ව්‍යාපෘතිය ආරම්භ කිරීම
- උපදේශක

| | |
|---|---|
| ඇ)අනුමත නොවූ තනතුරු 09 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත නිළධාරීන් 22 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර ඒ සඳහා රු.9,069,532 ක මුදලක් 2013 වර්ෂය තුළදී වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | කාර්යාංශයේ විෂය පථය පුළුල් වීම නිසා සහ නව අංශයන් එකතුවීම මත පවත්නා කාර්ය මණ්ඩලය තුළින් රාජකාරී කටයුතු ආවරනය කර ගැනීමට ඇති අපහසුතාවය නිරතුරුව අංශ භාර කළමණාකරුවන් විසින් ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී අනාවරණය කරන ලද අතර ඒ අනුව ඒ අංශයන්හි කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා කාර්යාංශයේ රාජකාරි කටයුතු සම්බන්ධ වැඩ අධ්‍යනයක් සිදු කොට පවත්නා රාජකාරී කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා අනුමත කාර්ය මණ්ඩලය වැඩි කර ගැනීමට අදාළ වාර්තාවන් විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුව වෙත යොමු කර ඇත.<br><br>කාර්යාංශය විසින් යොමු කරන ලද වාර්තාවන්ට අනුව කාර්යාංශයේ මිනිස්බල අනුමැතිය තවදුරටත් වැඩි කිරීමට අදාළ අනුමැතිය කළමණාකරන සේවා දෙපාර්තුමේන්තුවෙන් ලැබීමට නියමිතය. |
| **4.9.** <u>වාහන උපයෝජනය</u><br><br>පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.<br><br>අ)නිළධාරීන් 18 දෙනෙකු විසින් 2013 මාර්තු සිට දෙසැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළව අනුමත සීමාව ඉක්මවා ලබාගන්නා ලද රු.2,204,131 ක් වූ ඉන්ධන ලීටර් 13632.75 ක් සඳහා අදාළ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා අංක 99/2013/(m-7) ට අනුව මාසික අනුමත ඉන්ධන සීමාවලින් බැහැරව අත්‍යාවශ්‍ය රාජකාරී ගමන් සඳහා සභාපති හෝ සාමාන්‍යාධිකාරීගේ අනුමැතියට යටත්ව ලබා ගන්නා ලද අතිරේක ඉන්ධන වෙනුවෙන් අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අනුමැතිය ලබා ගැනීමට යොමු කර ඇත. |
| ආ) කාර්යාංශය විසින් 1999 නොවැම්බර් 12 වැනි දින රු2,075,000 කට මිලදී ගන්නා ලද ඉෂුසු ටූපර් ජීප් රථයක් සඳහා 1999 නොවැම්බර් සිට 2013 අගෝස්තු හෝ ඊට ආසන්න කාල සීමාව සඳහා කිලෝ මීටර් 174,142 ක් ධාවනය කර තිබුණි.එම කාල සීමාවට අදාළව සමස්ථ අලුත්වැඩියා වියදම රු.6,682,144 ක් වූ අතර වාහනයේ පිරිවැය මෙන් තුන් ගුණයකට ආසන්න මුදලක් අළුත්වැඩියාව සඳහා වැයකර තිබුණි. | අළුත්වැඩියා සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවන මෙම වාහන අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකෙරෙමින් පවතී. |
| **5.**<u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u><br><br>**5.1.** සංයුක්ත සැලැස්ම<br><br>කාර්යාංශය විසින් 2011-2015 කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද 2003 ජුනි 02 දිනැති අංක පිඒඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ 5.1.2 ඡේදය අනුව,සංයුක්ත සැලැස්මේ කාර්යයන් ඉටු කිරීම පිළිබඳ ප්‍රගතිය හා ක්‍රියාත්මක නොවුනු මන්දගාමී අංශ පිළිබඳ ඇගයීමක් කර ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් පිළියෙල කර නොතිබුණු අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට ලක්කර නොතිබුණි. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් වසර හතරක කාලසීමාවක් සඳහා එහි සංයුක්ත සැළැස්ම ද (2011-2015) එක් වර්ෂයක් සඳහා එහි වාර්ෂික සැලැස්ම ද එක් වර්ෂයක් සඳහා එහි වාර්ෂික සැළැස්ම ද (2013) සම්පාදනය කිරීමෙන් වි.සේ.නි. කාර්යාංශයට අදාළ කටයුතු සිදුකිරීම හා එම කටයුතු අධීක්ෂණය සිදුකරනු ලැබේ.විදේශ රැකියා ක්ෂේත්‍රය යනු ලෝකයේ වෙනත් |

| | |
|---|---|
| | රටවල පවතින සමාජීය,ආර්ථික,දේශපාලන,දේශගුණික හා වෙනත් බොහෝ සාධක මත නිරන්තරයෙන් වෙනස්වීම් වලට ලක්වන්නකි.එවැනි අවස්ථා වලදී විශේෂයෙන් විගමණික සේවකයන්ගේ ආරක්ෂාව හා සුභසාධනය සඳහා ඇතිවන බාහිර බලපෑම් වෙනුවෙන් කාර්යාංශය මඟින් ගන්නා ලද තීරණ හා ක්‍රියාකාරකම් නිරන්තරන්තරයෙන් වෙනස් කිරීමට සිදුවේ.<br><br>1988 සිට කාන්තා විගමණික ප්‍රතිශතය පිරිමින්ගේ සංඛ්‍යාව අභිබවා ගිය අතර ,මෙම කාන්තා විගමනය ඉහළ නැඟීම පාලනය කරගැනීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැළැස්මේ ක්‍රියාවලියන්හි ප්‍රගතිය නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලැබීය.සෑම වසරකම සෑම කාර්තුවක් අවසානයේ එළඹෙන ඊළඟ කාර්තුවේ ක්‍රියාකාරී සැළැස්මේ ප්‍රගතිය පරීක්ෂා කිරීම සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම පවත්වයි.මෙම ප්‍රගති සමාලෝචන රැස්වීමේදී ඒ ඒ කාර්යයන්හි ප්‍රගතිය ඊට පෙර වසරේ ප්‍රගතිය සමඟ සංසන්දනාත්මකව සලකා බැලීම කළමණාකාරීත්වයේ සහභාගීත්වයේ සිදුවේ.එහිදී ඒ ඒ කාර්තු වෙනුවෙන් ලබා දී ඇති ඉලක්ක සපුරා නොමැති අවස්ථා සඳහා විශේෂ අවධානය යොමු කරනු ලබයි.එම කරුණු හේතු පාදක කොට ගෙන වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම අර්ධ වාර්ෂිකව හේතු ඉදිරිපත් කරමින් සංශෝධනය සිදු කර අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලබයි.මෙම සියළු කරුණු ද සැලකිල්ලට භාජනය කර එළැඹෙන ඊළඟ වසරේ ක්‍රියාකාරී සැළැස්ම සම්පාදනය කරනු ලැබේ.<br><br>මෙම ක්‍රියාදාමයන් මඟින් සංයුක්ත සැළැස්මේ දක්වා ඇති කරුණු ක්‍රියාවට නැංවීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම සම්පාදනය කරනු ලැබේ.2013 වසරේ මුළු විගමණික සංඛ්‍යාව 293,105 දකුවා වැඩි කරගනිමින් පිරිමි ප්‍රතිශතය 62.48 දක්වා ඉහළ මට්ටම කරා ළඟා වීමටත් ,කාන්තා ප්‍රතිශතය 37.52 දක්වා පහත මට්ටමට ගෙන ඒමත් සමඟම සමාජ පිරිවැය අඩුකරගැනීමටත් ,2013 වර්ෂයේ ශ්‍රමික ප්‍රේෂණ ප්‍රමාණය වැඩි වීමත් මෙවැනි අධීක්ෂණය කිරීම් සහ නිරන්තර අවධානය යොමු කිරීම් තුලින් සිදුකල බව ඔබගේ අවධානය සඳහා ඉදිරිපත් කරමි. |
| **5.2.**<u>අයවැය ලේඛනමය පාලනය</u><br><br>පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය<br><br>අ) කාර්යාංශයේ ඇස්තමේන්තුගත වියදම හා තථ්‍ය වියදම අතර සියයට 11 ත් සියයට 629 ත් අතර විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | |
| ආ)සේවක සුභසාධක අරමුදලේ ඇස්තමේන්තුගත වියදම් අතර සියයට 33 ත් සියයට 100 ත් අතර විචලනයක් පැවති බැවින් එම අරමුදලින් ප්‍රමාණවත් සුභසාධන කටයුතු ඉටුකිරීම පිලිබඳ විගණනයට සෑහිමකට පත්විමට නොහැකි විය. | අයවැය ලේඛනය ඵලදායී කළමණාකරන ක්ෂේත්‍රයක් ලෙස යොදා ගැනීමට කාර්යාංශයට හැකි උපරිම උත්සාහයක් ගෙන ඇති අතර පසුකාලීන හා විශේෂ අවශ්‍යතාවයන් සඳහා වෙනුවෙන් විශේෂ අනුමැතීන් මත සිදු කරන ලද යම් යම් වියදම් හේතුවෙන් මෙම විචලනයන් සිදුව ඇති බව නිරීක්ෂණය වේ.<br><br>සේවක සුභසාධක අරමුදල යටතේ සිදුකිරීමට සැළසුම් කළ යම් යම් සුභසාධක |

| | |
|---|---|
| | වැඩ සටහන් සඳහා විගමණික ප්‍රජාවගේ ඉල්ලීමක් නොපැවතීම.මෙයට හේතු ලෙස දැක්විය හැක. |
| **5.3 විගණන හා කළමණාකරන කමිටු**<br><br>විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් 03 ක් පවත්වා තිබූ තීරණ අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය සඳහා යොමුකර නොතිබූ බව නිරීක්ෂණය විය. | 2014 වර්ෂය සඳහා දෙසැම්බර් මස විගණන හා කළමණාකරන කමිටු රැස්වීමක් පැවැත්වීමට නියමිතව තිබුණි.<br><br>පැවැත්වූ විගණන හා කළමණාකරන කමිටු වාර්තා සියල්ලම 2014.12.11 වන දින පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා සටහන් පත්‍රිකාවක් මාර්ගයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය සඳහා යොමු කිරීමට යොමු කර ඇත. |
| **6.පද්ධති හා පාලනයන්**<br><br>විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කාර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමු කළයුතු වේ.<br>අ) ගිණුම්කරණය<br>ආ) වාහන පරිපාලනය<br>ඇ) විදේශ දූත මණ්ඩලය මඟින් උපයන ආදයම් හා සේවා සැපයුම්<br>ඉ) වත්කම් උපයෝජනය | මෙම විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කිරීමට සටහන් කරගනු ලැබූ අතර ඒ අනුව මෙම ක්ෂේත්‍රයන්හි පවත්නා දුර්වලතා මගහරවා ගැනීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. |